සංඝමිත්තා බාලිකා විද්‍යාලය - ගාල්ල

ත්‍යාග ප්‍රදානෝත්සවය - 2024

2026 නොවැම්බර් මස 11 වන දින
ප.ව. 1.00 ට

පාසල් ගීතය

ජම්බුද්වීප නම් මනහර මහා දේශයේ
ධර්මශෝක රජුගේ දියණී සංඝමිත්ත ඒ
නේක රාජ සම්පත හැර පැවිදිව සස්නේ
ඒ උතුම් රහත් බවක් ලැබූ ඒ උත්තමාවගේ
ධීර වීර සීල ආදී අනගි ගුණ දහම්
බාල මේ අපි බැති පෙමින් පුරුදු කරමු දැන් .... //

සිරි ලක් කතුන්ට තිලකයක් වූ සඟමිත් මාතා ඒ
රැගෙන ආවෙ බෝ කුරක් මරාමිණක් මෙනේ
පෙර අප මුණී රජුට නැණ වඩන්නට සෙවණ දුන්
ඒ බෝපත්වල පැහැයෙන් යුත් ධජ ඔසවල දැන්
ලොවට පාමු සුසිරි දම් මෙසිප් බෙලෙන් ලැබූ
පතුරමු සෙත් ශාන්ති ශ්‍රී සමගි දම් වඩා .... //

සංඝමිත්ත නම් ලැබූ පාසලෙහි බාලිකා
ඒ නැණැති ගුණැති මාතාවගේ පාරේ අඩි තබා
ලංකා මාතාවන්ට සේව කරමු නිතියෙනා
සම්බුදු සසුන ලොවේ බබළවන්නටා

සම්බුදු සසුන ලොවේ බ බ ළ ව න් න ටා... //

සංඝමිත්තා බාලිකා විද්‍යාලය - ගාල්ල



කීර්තිමත් ආදි ශිෂ්‍යා,

කොළඹ විශ්ව විද්‍යාලයේ විද්‍යා පීඨයේ

ශාක විද්‍යා අධ්‍යයනාංශයේ

ශාක අණුක ජීවවංශවේදය හා පාරස්ථික් විද්‍යාව

(Plant Systematics and Ecology) පිළිබඳ

මහාචාර්ය හෂේන්ද්‍රා සුවිනි කත්‍රිආරච්චි මැතිණියගේ

සහභාගීත්වයෙන්

2026 නොවැම්බර් මස 11 වන දින ප.ව 1.00 ට

විද්‍යාලයීය ප්‍රධාන ශාලාවේදී

ත්‍යාග ප්‍රදානය සිදු කෙරෙන වගයි.

ත්‍යාග ප්‍රදානෝත්සවය 2024

- ආරාධිත අමුත්තන් ශාලාවට සම්ප්‍රාප්ත වීම
- පොල්තෙල් පහන දැල්වීම හා මඟුල් බෙර වාදනය
- පිළිගැනීමේ ගීතය
- පිළිගැනීමේ කතාව හා විද්‍යාලයීය වාර්තාව
- ත්‍යාග ප්‍රදානය I අදියර
- විවේක කාලය හා විශේෂාංගය
- ත්‍යාග ප්‍රදානය II අදියර
- ප්‍රධාන ආරාධිත දේශනය
- සිහිවටන ඵලකය පිළිගැන්වීම
- ස්තුති කතාව
- පාසල් ගීතය

2024 ත්‍යාග ප්‍රදානෝත්සවය
පිළිගැනිමේ ගීතය

සවනත කිතු වොරුඳි
නෙක පැහැ මල් ගුණ පැළඳි
තෙද බරණින් කිරුළු හිමි
සඟමිත් විදු මව් අසිරි
උළෙලයි මේ ජය නන්දා
විකුමන් පෙළහර ගෙනෙනා

සිප් නැණ ගුණ දම් සුවිසල්
ගැයුමින් රැඟුමින් මනකල්
පරිසර සිරිසර සුරුකී අහිමන් දියණී
මහාචාර්ය සුවිනී මැතිනී පිළිගමු හඳ තුටිනී

පෙරට යනෙන මග විමසන
දැයට පිනැති සිසු පුබුදන
විදුපති මෑණී.... වැප්ඛේ නිතිනී
නෙක වියත් මඬුලු සහා දිලෙන
උළෙලකි සසිරි
සැම පිළිගමු නිතිනී

ඉඩවරය මත වසත් දිය දී
දිවිය දලු ලන ගුරුන් දිරි දී
දෙගුරු පෙර සිසු නිති සවිය ගෙනෙනා
පිළිගනිමු සිත් සෙනෙහෙ මල් පළඳා

සවනත කිතු වොරුඳි .....

පද රචනය : කේ.ඩී.එස්. ලක්මිණි මිය

සංගීතය මෙහෙයවීම : පුෂ්පා දේවසිරිනාරායන මිය ඇතුළු පෙරදිග සංගීත අංශය

ප්‍රධාන ආරාධිත, කොළඹ විශ්ව විද්‍යාලයේ විද්‍යා පීඨයේ
ශාක විද්‍යා අධ්‍යයනාංශයේ මහාචාර්ය එච්. එස්. කත්‍රිආරච්චි මැතිණියගේ සුබ පැතුම් පණිවිඩය



දකුණුලක ප්‍රමුඛතම බෞද්ධ බාලිකා විද්‍යාලයක් වන ගාල්ල සංඝමිත්තා බාලිකා විද්‍යාලයේ වාර්ෂික ත්‍යාග ප්‍රදානෝත්සවය නිමිත්තෙන් මෙම සුබ පැතුම් පණිවිඩය එක් කිරීමට ලැබීම මා ලද සතුටක් මෙන්ම ගෞරවයක් ලෙස සලකමි. දශක ගණනාවක් පුරා අධ්‍යාපන ක්ෂේත්‍රයේ කීර්තිමත් මෙහෙවරක නිරත වෙමින් දැනුමෙන්, ගුණයෙන් හා හැකියාවෙන් පිරිපුන් ශිෂ්‍යාවන් සමාජයට දායාද කළ මාගේ පාසල් මෑණියන්ගේ මෙවන් සුවිශේෂී අවස්ථාවක් වෙනුවෙන් සුබ පැතුම් එක් කිරීමට ලැබීම පිළිබඳව මා තුළ ඇත්තේ අවංක සතුටකි.

ආදි සංඝමිත්තාවියක ලෙස මාගේ ජීවිතයේ අධ්‍යාපනික හා පෞරුෂමය පදනම ගොඩනැඟුණු පරිසරය සිහිපත් කරන විට සංඝමිත්තා බාලිකා විද්‍යාලය කෙරෙහි මා තුළ ඇත්තේ අසීමිත ගෞරවයකි. 1978 වසරේ සිට 1992 වසර දක්වා මාගේ පාසල් දිවිය මෙම විදු පියස තුළ ගත වූ අතර, එම කාලය තුළ මා ලැබූ අධ්‍යාපනය, ගුරු මඟපෙන්වීම සහ විෂය සමගාමී ක්‍රියාකාරකම් ඔස්සේ ලද අත්දැකීම් මාගේ අනාගත අධ්‍යාපනික හා වෘත්තීය ගමන්මඟ හැඩගැස්වීමෙහිලා වැදගත් පදනමක් විය. පන්තිකාමරය තුළින් ලැබූ දැනුමට අමතරව ගායනය, නාට්‍ය, කණ්ඩායම් ක්‍රියාකාරකම් සහ ශිෂ්‍ය නායකත්වය ඔස්සේ ලද පුහුණුව, විනය, සහයෝගිතාව, වගකීම සහ ආත්මවිශ්වාසය වැනි ගුණාංග වර්ධනය කර ගැනීමට මහෝපකාරී විය. ඒ සඳහා මඟපෙන්වූ විදුහල්පතිවරුන්, ගුරු මෑණිවරුන් හා පියවරුන් ඇතුළු සියලු දෙනා වෙත මෙම අවස්ථාවේදී මාගේ කෘතවේදීත්වය පළ කරමි.

අධ්‍යාපනය යනු විභාග ජයග්‍රහණ හා සහතිකපත්‍ර ලබාගැනීමට පමණක් සීමා වූ ක්‍රියාවලියක් නොවේ. එය පුද්ගලයකුගේ විචාරශීලී චින්තනය, නිර්මාණශීලීත්වය, සමාජීය සංවේදීතාව සහ ස්වාධීනව තීරණ ගැනීමේ හැකියාව වර්ධනය කරන අඛණ්ඩ ක්‍රියාවලියකි. විශේෂයෙන්ම වර්තමාන සමාජය හා ලෝකය මුහුණ දෙන සංකීර්ණ අභියෝග හමුවේ දැනුමෙන් පමණක් නොව, විචාරශීලී ආකල්පවලින්, නිවැරදි වටිනාකම්වලින් හා අභියෝග හමුවේ

නොසැලී ඉදිරියට යාමේ හැකියාවෙන් ද යුත් පරපුරක් බිහිකිරීම අධ්‍යාපනයේ ප්‍රධාන අරමුණක් විය යුතුය. එබැවින් අධ්‍යාපනික ජයග්‍රහණ මෙන්ම ක්‍රීඩා, කලා, සාහිත්‍ය, සෞන්දර්ය හා සමාජීය ක්‍රියාකාරකම් සඳහා ද ශිෂ්‍යාවන් යොමු කිරීම සහ ඔවුන්ගේ සහජ දක්ෂතා හඳුනාගෙන ඒවා සංවර්ධනය කිරීමට අවස්ථා සැලසීම පාසලකින් ඉටුවිය යුතු වැදගත් කාර්යභාරයකි.

මෙවැනි ත්‍යාග ප්‍රදානෝත්සවයක් යනු සිසුවියන්ගේ ජයග්‍රහණ ඇගයීමට ලක් කරන අවස්ථාවක් පමණක් නොව, ඔවුන් තුළ ඉදිරි අධ්‍යාපනික හා ජීවන අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා නව උද්යෝගයක් හා අභිප්‍රේරණයක් ඇති කරන වැදගත් අවස්ථාවකි. අද දින ඇගයීමට ලක්වන සියලුම සිසුවියන් වෙත මාගේ හෘදයාංගම සුබ පැතුම් පිරිනමන අතර, එම ජයග්‍රහණ පිටුපස පවතින කැපවීම, අධිෂ්ඨානය සහ අඛණ්ඩ උත්සාහය අනාගත ජයග්‍රහණ සඳහා ද පදනමක් කර ගන්නා ලෙස දිරිගන්වමි. එමෙන්ම මෙවර ඇගයීමට ලක් නොවූ සිසුවියන් ද තම අරමුණු කෙරෙහි විශ්වාසය තබමින් උත්සාහය අත්නොහැර ඉදිරියට ගමන් කරනු ඇතැයි අපේක්ෂා කරමි. සැබෑ ජයග්‍රහණය යනු තරගයකින් හෝ විභාගයකින් ලබන ප්‍රතිඵලයකට පමණක් සීමා නොවී, තමන් සතු හැකියාවන් උපරිමයෙන් වර්ධනය කරගනිමින් යහපත් හා වගකීම් සහගත පුරවැසියකු ලෙස සමාජයට දායක වීමයි.

මෙම අවස්ථාවේදී විද්‍යාලයේ වත්මන් විදුහල්පතිතුමිය ඇතුළු අධ්‍යයන හා අනධ්‍යයන කාර්ය මණ්ඩලය, පාසල් සංවර්ධන සමිතිය, ආදි ශිෂ්‍ය සංගමය සහ දෙමාපියන් වෙත ද මාගේ ගෞරවනීය ස්තුතිය පිරිනමමි. ශිෂ්‍යාවන්ගේ අධ්‍යාපනික හා පෞරුෂ සංවර්ධනය වෙනුවෙන් ඔවුන් දරන අඛණ්ඩ ප්‍රයත්නය සහ කැපවීම අගය කළ යුතුය.

අවසාන වශයෙන්, සංඝමිත්තා බාලිකා විද්‍යාලය අධ්‍යාපනික විශිෂ්ටත්වයෙන් මෙන්ම විනයගරුක, මානව හිතවාදී හා බුද්ධිමත් කාන්තා පරපුරක් බිහිකිරීමේ සිය මෙහෙවර අඛණ්ඩව ඉදිරියට ගෙන යාමට සමත් වේවායි ප්‍රාර්ථනා කරමි. මාගේ පාසල් මෑණියන්ටත්, එහි වත්මන් හා අනාගත ශිෂ්‍යාවන්ටත් සියලු කටයුතු සාර්ථක කර ගැනීමට සුබාශිංසන එක් කරමි.

මහාචාර්ය එච්. එස්. කත්‍රිආරච්චි
ශාක විද්‍යා අධ්‍යයනාංශය
කොළඹ විශ්වවිද්‍යාලය

විදුහල්පති වාර්තාව



වසර 107 ක අභිමානවත් ප්‍රෞඪ ඉතිහාසයකට උරුමකම් කියන දකුණුලක අග්‍රගණ්‍ය බෞද්ධ පාසල වන ගාල්ල සංඝමිත්තා බාලිකා විද්‍යාලයේ කිතුගොස ලක'ඹර වා තලයට මුසු කරමින් විරාජමාන වන විද්‍යාලයීය ත්‍යාග ප්‍රදානෝත්සවයේ සමාරම්භය මෙසේ සනිටුහන් කරමි.

ගෞරවණීය ස්වාමීන් වහන්ස, ප්‍රධාන ආරාධිත කීර්තිමත් ආදී ශිෂ්‍යා කොළඹ විශ්ව විද්‍යාලයේ ශාක විද්‍යා අධ්‍යයනංශයේ ශාක අණුක ජීවවංශවේදය හා පාරස්ථික් විද්‍යාව පිළිබඳ මහාචාර්ය හෂේන්ද්‍රා සුවිනි කත්‍රිආරච්චි මැතිනියනි, කලාප අධ්‍යාපන අධ්‍යක්ෂතුමියනි, ආරාධිත පාසල්වල විදුහල්පති මහත්ම මහත්මියනි, කොට්ඨාස අධ්‍යාපන අධ්‍යක්ෂතුමියනි, ආදී විදුහල්පති මහත්මියනි, පාසල් සංවර්ධන විධායක කමිටුවේ ලේකම්තුමා ඇතුළු කමිටු සාමාජික මහත්ම මහත්මියනි, ආදී ශිෂ්‍ය සංගමයේ ලේකම්තුමිය ඇතුළු විධායක කමිටු මහත්මියනි, විද්‍යාලයීය නියෝජ්‍ය,සහකාර විදුහල්පති මහත්ම මහත්මියනි, ආචාර්ය මණ්ඩලයේ සහෝදර මහත්ම මහත්මියනි, අනධ්‍යන කාර්ය මණ්ඩලයේ මහත්ම මහත්මියනි, ස්ථාන මාරු ලබා ගිය හා විශ්‍රාම ලැබූ ගුරු මහත්ම මහත්මියනි, අනෙකුත් සියලුම සම්භාවනීය අමුත්තනි , දෙමව්පියනි, ආදරණීය දියණිවරුනි ,

මේ අවස්ථාව එළඹී ඇත්තේ වාර්ෂික ත්‍යාග ප්‍රදානෝත්සවයට සපැමිණි ආරාධිත අමුත්තන් පිළිගැනීම හා පාසල් වාර්තාව ඉදිරිපත් කිරීමටයි. ඒ අනුව ප්‍රථමයෙන් ම මෙම අවස්ථාවට වැඩමවා වදාළ විද්‍යාලයීය ආචාර්ය මතුගම චන්ද්‍රාලෝක ස්වාමීන් වහන්සේ නමස්කාර පූර්වකව පිළිගනිමි.

2024 වසර පුරා දරුවන්ගේ හිත, හඳ, අත සුපෝෂණය කරගනිමින් සඟමිත් විදුපියසෙහි සෙවණ ලැබූ දරුවන් විවිධ ක්‍රියාකාරකම් තුළින් පාසල් නාමයට ගෙන දුන් කීර්තිය ඇගයීම අරමුණු කරගනිමින් මෙම ත්‍යාග ප්‍රදානෝත්සවය සංවිධානය කරන ලදී. ඒ සඳහා දරුවන් හට යහපත් පුර්වාදර්ශයක් ලබා දෙමින් දරුවන්ගේ ගමන් මග ආලෝකමත් කිරීම වඩාත් යෝග්‍ය බව පසක්වීම තුළ ඇය අද දින අප ප්‍රධාන ආරාධිත ලෙස මෙම අවස්ථාවට ඇරයුම් ලැබීය.

1978 වර්ෂයේ සඟමිත් විදුමව් තුරුලට පැමිණ, විදු මවගේ නොමද ආශිර්වාදය ලබමින් තම හැකියා වඩාත් ඔප්නංවා ගත් ඇය ගුණ නැණ බෙලෙන් යුතු ආදරණිය සඟමිත් දියණියක් වුවාය. පාසලේ පෙරදිග හා අපරදිග තූර්ය වාදක කණ්ඩායම්වල සාමාජිකාවක ලෙස විවිධ තරගවලට හා ක්‍රියාකාරකම්වලට සම්බන්ධ වෙමින් විද්‍යාලය නියෝජනය කරමින් ශේක්ෂ්පියර් නාට්‍ය තරග සඳහාද ඉදිරිපත් වෙමින් ජයග්‍රහණ අත්පත් කර ගත්තාය. එමෙන් ම සාහිත්‍ය සමිති ඇතුළු විවිධ සංගම්වල නිලතල දරමින් තම පෞරුෂය ශක්තිමත් කරගත් ඇය දීප්තිමත් කනිෂ්ඨ ශිෂ්‍ය නායිකාවක ලෙස පාසලේ අනෙකුත් සොයුරියන්ට පුර්වාදර්ශයක් සපයමින් විදුහලේ කීර්තිනාමය උදෙසා කටයුතු කළාය. අ.පො.ස. සාමාන්‍ය පෙළ විශිෂ්ට ලෙස සමත් වූ, ඇය ජීව විද්‍යා අංශයෙන් උසස් පෙළ සමත් වූවාය .

උසස් අධ්‍යාපනය සඳහා පේරාදෙණිය විශ්ව විද්‍යාලයට ඇතුලත් වූ ඇය වර්ෂ 1999 දී පේරාදෙණිය විශ්ව විද්‍යාලයෙන් උද්භිද විද්‍යාව පිළිබඳ විශේෂවේදී උපාධියත්, එම විශ්ව විද්‍යාලයේ පශ්චාත් උපාධි විද්‍යා ආයතනයෙන් වර්ෂ 2002 දී වනාන්තර පරිසර විද්‍යාව හා ප්‍රතිස්ථාපනය පිළිබඳ දර්ශනපති උපාධියත් හිමිකර ගත්තාය.මෙයින් නොනැවතුණු ඇය අධ්‍යාපනයේ නිම්වළලූ පුළුල් කරමින් ඔස්ට්‍රියාවේ වියානා විශ්ව විද්‍යාලයෙන් ශාක අණුක ජීවවංශවේදය පිළිබඳ ආචාර්ය උපාධිය ලබා ගත්තාය.

විවිධ තනතුරු හොබවමින් දැනට කොළඹ විශ්ව විද්‍යාලයේ විද්‍යා පීඨයේ ශාක විද්‍යා අධ්‍යයනංශයේ ශාක අණුක ජීවවංශවේදය හා පාරස්ථික් විද්‍යාව පිළිබඳ මහාචාර්යවරියක ලෙස කටයුතු කරන ඇය 2022 - 2025 කාලසීමාව තුළ එම අධ්‍යයනංශයේ ප්‍රධානී තනතුර ද හොබවමින් ශාක විවිධත්වය පරිණාමය හා සංරක්ෂණය පිළිබඳ ජාතික හා ජාත්‍යන්තර පර්යේෂණ රැසකට දායක වී ඇත. ජාත්‍යන්තර පර්යේෂණ සහයෝගිතා සහ සාමාන්‍ය උපාධි අපේක්ෂකයාගේ සිට ආචාර්ය උපාධි අපේක්ෂකයන් දක්වා පර්යේෂණ මගපෙන්වීම ඔස්සේ ඇය විද්‍යා ක්ෂේත්‍රයට වැදගත් සේවාවක් ඉටු කරමින් සිටින්නීය. දහසකුත් දුවා දරුවන්ගේ නැණස පෑදීමට මාර්ගෝපදේශකත්වය ලබාදෙමින් විවිධ තනතුරු දරමින් මහාචාර්යවරියක ලෙස සුපහන් සිතින් ලක'ඹර පමණාක් ම නොව ලොව පුරා දුවා දරුවන් දැනුම් සයුර තරණය කරවන්නට අත්වැලක් වූ, ඔබතුමියගේ එම වෘත්තීය ජීවිතය වත්මන් සඟමිත් දියණිවරුන්ට පුර්වාදර්ශයකි. සඟමිත් මාතාවට ඔබ සැමදාම සාඩම්බර දියණියකි.එදා සඟමිත් මව් ඇකයෙහි හැඳී

වැඩි සුන්දර අනාගතයකට මග පාදා ගත් ඔබතුමිය, මෙම ත්‍යාග ප්‍රදානෝත්සවය වර්ණවත් කිරීමට පැමිණීම අපට මහත් ගෞරවයක් වන අතර ඔබතුමිය ඉතාමත් ගෞරවයෙන් පිළිගනිමි.

නිරන්තරයෙන් අපට අවශ්‍ය සහාය ලබාදෙන කලාප අධ්‍යාපන අධ්‍යක්ෂතුමියත්, කොට්ඨාස අධ්‍යාපන අධ්‍යක්ෂතුමියත් මෙම අවස්ථාවට පිළිගනිමි. එමෙන්ම හිටපු විදුහල්පති මහත්මීන් ඉතාමත් ගෞරවයෙන් පිළිගනිමි. ආරාධිත පාසල්වල විදුහල්පති මහත්ම මහත්මීන්, ආරාධිත පාසල් නියෝජනය කරමින් පැමිණි නියෝජ්‍ය, සහකාර විදුහල්පති මහත්ම මහත්මීන් ද මෙම අවස්ථාවට පිළිගනිමි. විද්‍යාලයේ නියෝජ්‍ය, සහකාර විදුහල්පති මහත්ම මහත්මීන් සහ ආචාර්ය මණ්ඩලයේ ගුරු භවතුන් සියලු දෙනාමත්, පාසල් සංවර්ධන විධායක කමිටු ලේකම්තුමා ඇතුළු කමිටු සාමාජික සියලු දෙනාමත් , ආදී ශිෂ්‍ය සංගමයේ ලේකම්තුමිය ඇතුළු සාමාජිකාවන් සියලු දෙනාමත්, ස්ථාන මාරු ලබා ගිය හා විශ්‍රාම ලැබූ ගුරුවරුන් සියලු දෙනාමත්, අනධ්‍යන කාර්ය මණ්ඩලයේ මහත්ම මහත්මීන් සියලු දෙනාමත්, ආදරණීය දෙමව්පියන් හා ආදරණීය දියණිවරුන් සියලු දෙනාමත් මෙම අවස්ථාවට පිළිගනිමි.

සඟමිත් දැක්ම කරා පාසල මෙහෙයවීමේදී විධිමත්, නොවිධිමත් හා අවිධිමත් විෂයමාලා ත්‍රිත්වයම සමබරව ක්‍රියාත්මක කිරීම මගින් 2024 වර්ෂය තුළ දියණිවරුන් ලැබූ ජයග්‍රහණයන් මෙසේ දිග හරිමි.

එම වර්ෂයේදී ශිෂ්‍යත්ව විභාගයට පෙනී සිටි ශිෂ්‍ය සංඛ්‍යාව 270 කි. ලකුණු 70% මට්ටම ඉක්මවූ ශිෂ්‍ය ප්‍රතිශතය 98.52% කි. සිසුන් 86 දෙනෙක් කඩඉම් ලකුණු මට්ටම ඉක්මවන ලද අතර එම ප්‍රතිශතය 31.85% කි.

අ.පො.ස. සාමාන්‍ය පෙළ විභාගය සඳහා පෙනී සිටි ශිෂ්‍ය සංඛ්‍යාව 390 ක් වූ අතර , සමත් ශිෂ්‍ය සංඛ්‍යාව 363 කි. ඒ අනුව 2024 වර්ෂයේදී 93.08% ක සාධනීය මට්ටමක් වාර්තා කිරීමට සමත්විය. සියලුම විෂයන්ට A සාමාර්ථ ලබාගත් සිසුවියන් සංඛ්‍යාව 91 කි. A සාමාර්ථ 8 ක් ලබාගත් සිසුවියන් සංඛ්‍යාව 48 ක් වේ.

2024 වර්ෂයේදී අ.පො.ස. උසස්පෙළ විභාගය සඳහා පෙනී සිටි ශිෂ්‍ය සංඛ්‍යාව 534 ක් වන අතර , විද්‍යාලය අත් කර ගත් සාධනීය මට්ටම 78.46% කි. ජීව විද්‍යා අංශයෙන් පෙනීසිටි ශිෂ්‍ය සංඛ්‍යාව 214 ක් වන අතර, සමත් ශිෂ්‍ය සංඛ්‍යාව

149 කි. ප්‍රතිශතය 69.63% කි. භෞතික විද්‍යා අංශයෙන් පෙනී සිටි ශිෂ්‍ය සංඛ්‍යාව 68ක් වන අතර, සමත් ශිෂ්‍ය සංඛ්‍යාව 54 ක් විය. එහි ප්‍රතිශතය 79.4% කි. වාණිජ අංශයෙන් ශිෂ්‍යාවන් 107 ක් පෙනී සිටි අතර සමත් ශිෂ්‍ය සංඛ්‍යාව 102 කි. එහි ප්‍රතිශතය 95.33% කි. කලා අංශයෙන් ශිෂ්‍යාවන් 128 ක් පෙනී සිටි අතර සමත් ශිෂ්‍ය සංඛ්‍යාව 105 කි. එහි ප්‍රතිශතය 82.03% කි.

2024 වර්ෂයේදී අ.පොෂ. උසස්පෙළ විභාගය සඳහා පෙනී සිටි ශිෂ්‍යාවන්ගෙන් 419 දෙනෙක් විශ්ව විද්‍යාල ප්‍රවේශය සඳහා සුදුසුකම් ලැබූ අතර, වෛද්‍ය විද්‍යාව සඳහා තේරී පත්වූ ශිෂ්‍ය සංඛ්‍යාව 22 ක් ද , පශු වෛද්‍ය අංශය සඳහා තේරී පත්වූ ශිෂ්‍ය සංඛ්‍යාව 3 ක් ද , වෙනත් පාඨමාලා සඳහා 54ක් ද තේරී පත්විය. ගණිත අංශයෙන් ඉංජිනේරු විද්‍යාව සඳහා ශිෂ්‍යාවෝ 8 දෙනෙක් ද, වෙනත් පාඨමාලාවන් සඳහා 40 දෙනෙක් ද තේරී පත්විය. වාණිජ අංශයේ කළමනාකරණ පාඨමාලාව සඳහා ශිෂ්‍යාවන් 14 දෙනෙක් ද, වෙනත් පාඨමාලා සඳහා 39 දෙනෙක් ද ,කලා අංශයෙන් නීති පීඨයට ශිෂ්‍යාවන් 3 දෙනෙක් ද , වෙනත් පාඨමාලා සඳහා කලා හා සෞන්දර්ය විෂය ධාරාවෙන් 47 දෙනෙක් ද විශ්ව විද්‍යාලයට තේරී පත්විය.

ජීව විද්‍යා ඉංග්‍රීසි මාධ්‍ය අංශයෙන් දිස්ත්‍රික් දෙවන ස්ථානය දිනාගැනීමට දිනිති දිල්මිණි බණ්ඩාරනායක ශිෂ්‍යාව සමත් වූ අතර ජීව විද්‍යා සිංහල මාධ්‍ය අංශයෙන් දිස්ත්‍රික් 6 වන ස්ථානය පී.බී.එම්. පිණිකහන ගමගේ ශිෂ්‍යාව ද, භෞතීය විද්‍යා විෂය ධාරාවෙන් අයි. අප්සරා සමරසේකර ශිෂ්‍යාව දිස්ත්‍රික් කුසලතාවය 19 වන ස්ථානය ද, වාණිජ විෂය ධාරාවෙන් දිස්ත්‍රික් කුසලතාවය 4 වන ස්ථානය ලබා ගැනීමට අප විද්‍යාලයේ ජේ.පී. නොමිශා තනුජී යන ශිෂ්‍යාව ද සමත් විය. කලා විෂය ධාරාවෙන් දිස්ත්‍රික් 15 වන ස්ථානය දිනාගැනීමට පී.කේ. නදුනි තත්සරණී ශිෂ්‍යාව සමත් වුවාය. ජීව විද්‍යා, භෞතික විද්‍යා හා කලා යන අංශවලින් දිස්ත්‍රික් කුසලතාවය 1 සිට 20 දක්වා ස්ථාන හිමිකර ගනිමින් ශිෂ්‍යාවන් 7 දෙනෙකු විසින් විශිෂ්ට දක්ෂතාවයන් දක්වන ලදී.

අනාගත වැඩ ලෝකය ජයගැනීමට විෂයානුබද්ධ දැනුමින් පෝෂිත උගත් බුද්ධිමතුන් පමණක් නොව මනා නායකත්වයකින් හා සමබර පෞරුෂයකින් හෙබි ලොව දිනන දියණියන් රටට දායාද කරන සඟමිත් විදු පියසේ විෂය සමගාමී ක්‍රියාකාරකම් හා ක්‍රීඩාවන් 70 ක් පමණ මේ වන විට පාසල තුළ ක්‍රියාත්මක වේ. එම ක්‍රියාකාරකම් හේතුවෙන්

2024 වර්ෂය තුළ ලබාගත් විෂය සමගාමී ජයග්‍රහණ රැසකි. ජාත්‍යන්තර තලය ද දිග් විජය කරගැනීමට අප දියණියන් සමත් වූ බව මේ මොහොතේ හදපිරි සතුටින් සිහිපත් කරමි.

බටහිර ආසියානු යොවුන් චෙස් තරගාවලියේ 12න් පහළ බාලිකා ශූරතාවය සහ යොවුන් වේගී චෙස් තරගාවලියේ අනු ශූරතාවයද , පොදු රාජ්‍ය මණ්ඩලීය යොවුන් චෙස් තරගාවලියේ තරග ඉසව් කිහිපයකින්ද ජාත්‍යන්තර ජයග්‍රහණ රැසක් දිනාගැනීමට ද , ශ්‍රී ලංකා පාසල් චෙස් සංගමය මගින් සංවිධානය කරන ලද සමස්ත ලංකා ජාතික යොවුන් චෙස් තරගාවලියේ දෙවන ස්ථානය ද , ජාතික යොවුන් චෙස් තරගාවලියේ 12 න් පහළ ඒකල ශූරතාවය ද , ශ්‍රී ලංකා පාසල් කණ්ඩායමේ චෙස් ශූරතාවය (4 වන පුවරුවේ දක්ෂතම ක්‍රීඩිකාව), ශ්‍රී ලංකා ජාතික චෙස් විශිෂ්ටතම සම්මානය ඇතුළු සම්මාන රැසක් දිනා ගැනීමට එස්.දෙව්හාරා පල්ලියගේ දියණිය සමත් වුවාය.

උස්බෙකිස්තානයේ පැවති ආසියානු පිම්නාස්ටික් තරගාවලිය සඳහා ශ්‍රී ලංකා කණ්ඩායම නියෝජනය කිරීමට ද, 48 වන ජාතික මහා ක්‍රීඩා තරගාවලියේ තරග ඉසව් කිහිපයකම විශිෂ්ට ජයග්‍රහණයන් ලබමින් ශ්‍රී ලංකා කණ්ඩායම් නියෝජනයන් සඳහා තේරී පත්වෙමින් සමස්ත ලංකා පාසල් පිම්නාස්ටික් තරගාවලියේ දක්ෂතම ක්‍රීඩිකාව ලෙස ද ජේ.එල්.ඒ. ලූහාරා ගයත්මි ශිෂ්‍යාව සුදුසුකම් ලැබුවාය. එමෙන් ම එම තරගාවලියේ සසඳී දිසාලි ශිෂ්‍යාව 16 න් පහළ දෙවන ස්ථානය ද, වයි. යුහංසා ගරුසිංහ 14න් පහළ තෙවන ස්ථානය ද, 16 න් පහළ බාලිකා ඩබ්.ඩී.රිසින්දී කිත්සරා දියණිය තුන්වැනි ස්ථානය ද දිනාගන්නා ලදී.

පකිස්තානයේ පැවති දකුණු ආසියානු කනිෂ්ඨ බැඩ්මින්ටන් තරගාවලියේ ශ්‍රී ලංකා කණ්ඩායම නියෝජනය කරමින් වයස අවු. 19 න් පහළ ශූරතාවය ද , 52 වන කනිෂ්ඨ බැඩ්මින්ටන් තරගාවලියේ වයස අවු. 15 න් පහළ ඒකල සමස්ත ලංකා ශූරතාවය ද , එම්.ජී. තෙනුකි අයන්සා දියණිය විසින් දිනා ගන්නා ලදි.

ඉන්දුනීසියාවේ පැවති 8 වන ආසියානු පාසල් බැඩ්මින්ටන් තරගාවලිය සඳහා ශ්‍රී ලංකාව නියෝජනය කිරීමටද , 52 වන කනිෂ්ඨ බැඩ්මින්ටන් තරගාවලියේ 17 න් පහළ බාලිකා තරගයේ අර්ධ අවසාන වටයට සුදුසුකම් ලැබීමට ද,පවනි

ඉලේපෙරුමාච්චි දියණිය සමත් වූවාය. එම තරගාවලියේම වයස අවුරුදු 17 න් පහළ යුගල ශූරතාවය රළින්දි උමගිලිය දියණිය විසින් දිනාගන්නා ලදී.

ශ්‍රී ලංකා පාසල් පිම්නාස්ටික් ශූරතාවලියේ ප්‍රථම ස්ථානය දිනා ගැනීමට බී.පී. පබනු ගනීෂා දියණිය සමත් වූ අතර එම තරගාවලියේම 13 න් පහළ තරග අංශ කිහිපයකම ප්‍රථම ස්ථාන සහ ජාතික කණිෂ්ඨ පිම්නාස්ටික් ශූරතාවලියේ දෙවන, තෙවන හා 12 න් පහළ ශූරතාවය දිනා ගැනීමට ඒ.පී.එල්. දහම්දි කෙහාරා දියණිය සමත් වූවාය. එම තරගාවලියේ ම වයස අවු. 13 න් පහළ දෙවන ස්ථානය දිනා ගැනීමට විතුලි එස්.පී. පතිරගේ දියණිය සමත් වූවාය.

ශ්‍රී ලංකා පාසල් කණිෂ්ඨ 13 න් පහළ කරාතේ ශූරතාවය දිනා ගැනීමට වි.පී. සත්නාරා තත්නදී දියණිය සමත් වූ අතර එම තරගාවලියේ ම වයස අවු. 16 - 17 වයස් සීමාව තෙවන ස්ථානය කේ.පී. සමිදි සිත්හාරා දියණිය විසින් දිනා ගන්නා ලදි.

එමෙන් ම ඇරොබික් පිම්නාස්ටික් තරගාවලියේ Gym for Life Challenge 2024 ප්‍රථම ස්ථානය දිනා ගැනීමට අප විද්‍යාලයීය කණ්ඩායම සමත් වූවාය.

ජාතික පාසල් පිහිනුම් තරගාවලියේ තරග කීපයකින්ද ජාතික මට්ටමේ විශිෂ්ට ජයග්‍රහණ රාශියක් දිනාගැනීමට සේයා යහන්මි කාරියවසම් ශිෂ්‍යාව සමත් වූවාය. ජවන හා පිටිය එකලූ කරමින් සමස්ත ලංකා පාසල් මලල ක්‍රීඩා වයස අවුරුදු 20 න් පහළ හෙල්ල විසිකිරීම දෙවන ස්ථානය සහ ශ්‍රී ලංකා මලල ක්‍රීඩා සංගමය මගින් පවත්වන ලද තරග රැසකින් ජයග්‍රහණය කිරීමට බී. සංජුලා දිව්‍යාංජලී ශිෂ්‍යාව සමත් වූවාය.

මැලේසියාවේදී පැවති 47 වන Pesta හොකී තරගාවලිය සඳහා ශ්‍රී ලංකාව නියෝජනය කරමින් 18 න් පහළ තශ්මිකා අමන්දිනි හේවාගම ප්‍රථම ස්ථානය දිනාගන්නා ලදී. එමෙන්ම එම තරගාවලිය සඳහා ශ්‍රී ලංකා කණ්ඩායම නියෝජනය කරමින් පී.පී.තරුලි දහම්සා දියණිය සහභාගී වුවාය.

14 වන ශ්‍රී ලංකා පාසල් ටයිකොන්ඩෝ කනිෂ්ඨ තරගාවලියේ 3 වන ස්ථානය දිනා ගැනීමට අයි.එස්. අබේවර්ණ ශිෂ්‍යාව සමත් වූවාය.

විද්‍යාලයීය විද්‍යා ගණිත අංශයෙන් ද හෙට දින ලොව දිනන්නට මංපෙත් විවර කර ගැනීමට සූදානම්ව සිටින අප දියණියන් එම අංශවලින් ජයග්‍රහණ රැසක් දිනා ගැනීමට සමත් වුවාය.

නේපාලයේ කත්මණ්ඩුහි දී පැවති තුන්වන ජාත්‍යන්තර තාරකා විද්‍යා හා තාරකා භෞතීය විද්‍යා ඔලිම්පියාඩ් තරගාවලියේ ශ්‍රී ලංකා කණ්ඩායමේ කනිෂ්ඨ සාමාජිකාවක ලෙස ගෞරවණීය සම්මානයට පාත්‍ර වීමට එච්.බී.ජී. සිහලි දිනෝදා ශිෂ්‍යාව සමත් වුවාය.

ඉන්දියාවේ ලක්නව් හි India Nagar විශ්ව විද්‍යාලයට අනුබද්ධිත City Montessori School මගින් පැවැත්වූ 16 වන Macfair International සමුළුවේදී පැවැත්වූ තරග රාශියකින් ජයග්‍රහණය කිරීමට අප විද්‍යාලයීය ශිෂ්‍ය කණ්ඩායම සමත් විය.

16 වන ශ්‍රී ලංකා තාරකා විද්‍යා හා තාරකා භෞතීය විද්‍යා ඔලිම්පියාඩ් තරගාවලියේදී රිදී පදක්කම දිනාගැනීමට ඩී.තත්සරි ගමගේ ශිෂ්‍යාවද, එම තරගාවලියේ ම කනිෂ්ඨ අංශය නියෝජනය කරමින් ඒ.වී.ඉනුලි බිනායා සහ ඒ.අයි. වන්නිආරච්චි යන දියණියන් ලෝකඩ පදක්කම් දිනා ගැනීමටද සමත් විය. විද්‍යා පර්යේෂණ ව්‍යාපෘති තරගාවලිය ජාතික මට්ටමේ 4 වන ස්ථානය දිනා ගැනීමට ලකිති සසෙන්යා එස්. කුරුප්පුගේ ශිෂ්‍යාව සමත් වූවාය. එම තරගාවලියේ ම ජයග්‍රහණ රැසක් දිනාගැනීමට අප දියණියන් සමත් වූහ.

විද්‍යාලයීය සෞන්දර්යය අංශය පාසලේ කීර්තිනාමය දසත පතුරවන්නට ලබාදෙන්නා වූ දායකත්වය මේ මොහොතේ සිහිපත් කරන්නේ ඉමහත් සොම්නසිනි. සමස්ත ලංකා පෙරදිග සංගීත අංශයෙන් සමුහ ගී අනුවාදන විවෘත (සඳකැන් දහරින්) ප්‍රථම ස්ථානයද , ඒකල වාදන හින්දුස්ථානි රාගධාරී සිතාර අංශයෙන් උසාක්‍යා නානායක්කාර දියණිය ප්‍රථම ස්ථානයද එම තරග අංශයේ ම බටනළා වාදනය ප්‍රථම ස්ථානය කේ.කේ.එච්.වයි. ඉඳුවරිණි සිල්වා දියණිය විසින් ද දිනා ගන්නා ලදී.

සමස්ත ලංකා පාසල් නාට්‍ය හා රංගකලා උළෙලේදී ඔතෙලෝ නාට්‍ය හොඳම නිළිය ඩබ්.කේ. අහස්නා නිම්සති දියණිය දිනාගත් අතර මෙහිදී එස්.ඔනාරා විජේසිංහ දියණිය කුසලතා සම්මානයද හිමි කර ගත්තාය. සමස්ත ලංකා පාසල් නාට්‍ය හා රංගකලා උළෙල - 2024 ඔතෙලෝ ඩෙස්ඩිමෝනා චරිතය සඳහා කුසලතා සම්මානය ඊ. එන්. පුනාරා දේවින්දි දියණිය විසින් දිනා ගන්නා ලදී.

භාෂාව හා සාහිත්‍යය මිනිසා සුපෝෂණය කරයි. සිංහල , ඉංග්‍රීසි සහ දෙවන බස දෙමළ යන භාෂා ත්‍රිත්වයෙන්ම සඟමිත් දියණියන් පාසලට ඉමහත් අභිමානයක් ගෙන දෙමින් විවිධ ක්‍රියාකාරකම්වල නිරත වුවා පමණක්ම නොව ජයග්‍රහණ රැසක්ද ලබාගන්නා ලදී. ලෝක දියවැඩියා දිනය නිමිත්තෙන් පැවැත්වූ සමස්ත ලංකා පාසල් තරගාවලියේ ජ්‍යෙෂ්ඨ රචනා අංශයෙන් භාෂිතා අයි.ඩයස් ගුණවර්ධන දියණිය ජයග්‍රහණය කරන ලදී. එමෙන්ම සමස්ත ලංකා සමාජ විද්‍යා තරගාවලියේ කනිෂ්ඨ අංශයේ 7 ශ්‍රේණියේ තෙවන ස්ථානය දිනාගැනීමට එන්.ඩබ්.ඒ. විරති දෙහන්සා ශිෂ්‍යාව ද සමත් වූවාය.

සමස්ත ලංකා ඉංග්‍රීසි භාෂා තරගාවලියේ ජ්‍යෙෂ්ඨ අංශයේ රචනා තරගාවලියේ දෙවන ස්ථානය හිරුකි බාලපටබැඳි දියණිය විසින් දිනාගන්නා ලදී. ජාතික මට්ටමේ ඉංග්‍රීසි භාෂා හා නාට්‍ය තරගාවලියේ ශේක්ෂ්පියර් නාට්‍ය අංශයේ දෙවන ස්ථානය විද්‍යාලයීය ජ්‍යෙෂ්ඨ නාට්‍ය කණ්ඩායම විසින් දිනා ගැනීමට සමත් වූ අතර ජී.ජී.ටී.ඒ. රෝසමලී දියණිය හොඳම නිළිය ලෙස කුසලතා සම්මානයක් දිනා ගත්තා ය. එම තරගාවලියේම දෙවන ස්ථානය දිනා ගැනීමට ප්‍රාථමික නාට්‍ය කණ්ඩායමේ දියණියන් සමත් වුවාය.

සමස්ත ලංකා දෙවන භාෂා තරගාවලිය කියවීම් අංශය තෙවෙනි ස්ථානය දිනා ගැනීමට අප විද්‍යාලයේ එන්.ඒ. සුවන්මි දුලනිමා දියණිය සමත් වුවාය.

එමෙන්ම ජාත්‍යන්තර තලයේ ලෝක සම්මේලන සඳහා සහභාගී වීමට අප දියණියන් හට අවස්ථාව උදා විය.

ඉන්දියාවේ ලක්නව්හි India Nagar විශ්ව විද්‍යාලයට අනුබද්ධිත City Montessori School මගින් පැවැත්වූ 22 වන ජාත්‍යන්තර පරිගණක ඔලිම්පියාඩ් සමුළුව COFAS 2024 සඳහා අප දියණියන් සහභාගී වූ අතර එහිදී ජයග්‍රහණ රැසක් දිනාගැනීමටත් හැකි විය.

ග්‍රීසියේ ඇතැන්ස් හි පැවති 5 වන ලෝක සංස්කෘතික උරුම යොවුන් සම්මේලනය සඳහා දකුණු ආසියාවේ එකම පාසල් නියෝජනය ලෙස සහභාගී වී යුරෝපිය පාසල් 25ක් අතරින් හොඳම ඉදිරිපත් කිරීම සහ හොඳම කණ්ඩායම සඳහා ලබා දෙන එකම ගෞරව සම්මානය අප දියණියන් විසින් දිනාගන්නා ලදී.

ඇමරිකා එක්සත් ජනපදයේ නිව්යෝක්හි පැවති MUN ජාත්‍යන්තර සම්මේලනය සඳහා සහභාගී වීමට අප දියණියන්ට හැකි විය.

ගුණධර්ම වලින් හා විනයවත් බවින් යුතු කාන්තා නායිකාවන් ලෙස සඟමිත් දියණියට අත්දැකීම් ලබා දීමට විෂය බාහිර ක්‍රියාකාරකම් රැසක් ද 2024 වර්ෂය තුළ ක්‍රියාත්මක කරන ලදී.

ඒ අනුව පිරිත් පිංකම හා දානය, නිවාසාන්තර ක්‍රීඩා උත්සවය, පිහිනුම් ක්‍රීඩා උත්සවය, අවුරුදු උත්සවය , වෙසක් කූඩු නිර්මාණය සහ සීල වැඩසටහන, පොසොන් බැති ගී සරණිය , ශිෂ්‍ය නායිකා නිළ ලාංඡන පැළඳවීම , ශිෂ්‍ය නායිකා පුහුණු වැඩමුළුව පැවැත්වීම, භාෂා දින පැවැත්වීම, විද්‍යා, වාණිජ හා කලා දිනයන් පැවැත්වීම හා වාර්ෂික දළඳා පිංකම ඒ අතර ප්‍රධාන වේ.

අප මෙවැනි වැඩසටහන් රාශියක් සිදු කරනු ලබන්නේ මහත් අභියෝග හමුවේය. සඟමිත් දියණියන්ගේ හෙට දවස වඩාත් අර්ථවත් කරන්නට එම අභියෝග ජයගනිමින් මම ඇතුලූ මගේ කණ්ඩායම වගකීමෙන් හා කැපවීමෙන් කටයුතු කරන බව අවධාරණය කරමි. එම අභියෝග අතර පිහිනුම් ක්‍රීඩා උත්සවයක් පවත්වන දකුණුලක එකම බාලිකා පාසල අප බවත් පාසලට පිහිණුම් තටාකයක් නොමැති වීමත්, ශ්‍රවණාගාරයක් නොමැති වීමත් අප දියණියන්ට මහත් අඩුපාඩුවක් ලෙසත් මම දකිමි. එම පහසුකම් අප දියණියන්ට ලබා දීමේ සිහිනය මල්ඵල දරන්නට කාලය එළඹ ඇතැයි මම විශ්වාස කරන්නෙමි.

එදා සඟමිත් විදු බිමෙහි හැදී වැඩි සුන්දර අනාගතයකට මග පාදා ගත් ඔබතුමිය අප සමග මෙම සොඳුරු අවස්ථාව දැකබලා ගන්නට පැමිණීම පිළිබඳව හදවතින්ම සතුටු වන අතර මේ මොහොතේ ඔබතුමියට සුභ පැතුම් පිරිනමමි. කලාප, කොට්ඨාස කාර්යාලවලින් පැමිණි අධ්‍යක්ෂකතුමන්ලා ඇතුළු නිළධාරී මහත්ම මහත්මිනි , මේ සියලු කටයුතු සඳහා මාහට ලබාදෙන සක්‍රීය දායකත්වය වෙනුවෙන් ඔබ සියලු දෙනාටම කෘතවේදීත්වය පිරිනැමීමට මෙය අවස්ථාවක් කර ගනිමි.

බාධක ජයගනිමින් ජයග්‍රහණය කරා යන ගමනේදී මා පිටුපස සෙවනැල්ල මෙන් සිටින නියෝජ්‍ය විදුහල්පති මහත්ම මහත්මීන්, සහකාර විදුහල්පති මහත්මීන්,ආචාර්ය මණ්ඩලය සහ අනධ්‍යයන කාර්ය මණ්ඩලය දෙන සහයෝගය හා කැපවීම මම මෙහිදී ස්තුති පුර්වක ව සිහිපත් කරමි.

ආදරණීය දෙමව්පියනි, මේ දිදුලන්නේ ඔබගේ තරු කැට යි. මේ අභිමානවත් දිනය උදා කර දෙන්නට ඔබ ද ශක්තියක් වන බව මම දනිමි. විද්‍යාලයේ සියලු කටයුතු කෙරෙහි නිරන්තර සක්‍රීය දායකත්වය දෙමින් අප සමග සිටින පාසල් සංවර්ධන සමිතියේ නිලධාරී මණ්ඩලයේ සියලුම මහත්ම මහත්මීන් ඇතුළු සඟමිත් දෙමව්පිය ප්‍රජාවට මගේ හෘදයාංගම ස්තුතිය පුද කරමි. සඟමිත් ආදී දියණිවරුන් වන ඔබ මේ සියලු ජයග්‍රහණයන්ගේ තවත් එක් පාර්ශවයකි. අපහට ශක්තියක් වන ඔබ සියලු දෙනාටම ද මගේ ස්තුතිය මේ අවස්ථාවේ පුද කර සිටිමි.

සඟමිත් ලක් අඹරේ දිලෙන තරු කැට සඟමිත් මව ආලෝකමත් කරන මේ මොහොතේ 2024 ත්‍යාග ප්‍රදානෝත්සවය සඳහා මෙහි පැමිණි මහාචාර්ය හෂේන්ද්‍රා සුවිනී කත්‍රිආරච්චි මැතිණිය ඇතුළු ඔබ සියලු දෙනාට අප වෙත දැක්වූ සහයෝගය අගය කරමි.

ස්තූතියි !
අසේනි ඩී. පරණවිතාන
විදුහල්පතිනිය
ගා/සංඝමිත්තා බාලිකා විද්‍යාලය

බෞද්ධ සංගමය

සභාපති	:	ඩී.එල් දිමුතු දර්ශන මයා
ලේකම්	:	අයේශා දේනෙත්ති මිය
භාණ්ඩාගාරික	:	ආර්.එල්. ගුරුගේ මිය

පාසල් ප්‍රජාවට සෙත් ප්‍රාර්ථනා කිරීම හා ආශීර්වාද කිරීම අරමුණු කර ගනිමින් 2024 වර්ෂයේදී බෞද්ධ සංගමය මගින් වාර්ෂිකව පවත්වනු ලබන සර්ව රාත්‍රික පිරිත් දේශනය හා සංඝගත දක්ෂිණාව සාර්ථක ලෙස සිදු කරන ලදී. සම්බුදු තෙමඟුල සිහිපත් කරමින් විද්‍යාල සියලුම දියණියන් ශීල භාවනා වැඩසටහනක නිරත කරවන ලදී. තවද වෙසක් කූඩු, පහන් වැටි, විදුලි බුබුළු ආදිය මගින් විදුහල් භූමිය ආලෝකමත් කරන ලදී.

පොසොන් පොහොය නිමිති කොට අලංකාරවත් පොසොන් බැති ගී ප්‍රසංගයකින් විද්‍යාලයීය භූමිය ප්‍රබෝධමත් කරන ලදී. තවද කරාපිටිය පිළිකා රෝහලට දානය පිරිනැමීම මගින් සමාජ සත්කාරයක් ද සිදුකරන ලදී. වසර පුරා පැවැති අ.පො.ස (සා. පෙළ) අ.පො.ස (උසස් පෙළ) පහ වසර ශිෂ්‍යත්ව කඩයිම් විභාග සඳහා ඉදිරිපත් වන ශිෂ්‍යාවන්ට ආශීර්වාද සඳහා සෙත් පිරිත් දේශනා සිදු කරවන ලදී.

පළමු ශ්‍රේණියට ශිෂ්‍යාවන් ඇතුළත් කිරීමේදී සෙත් පිරිත් දේශනා සිදු කරනු ලැබූ අතර වාර්ෂිකව ශ්‍රී දළදා වහන්සේ උදෙසා දළදා මාලිගාවේ පවත්වනු ලබන පින්කමද උසස් අයුරින් සිදු කරන ලදී. 2024 වසර අවසානයේ පාසල් බුද්ධ මන්දිරයේ පොළොවේ ටයිල් කැට අතුරා නවීකරණය කරන ලදී.

වසර පුරා මෙම කටයුතු සාර්ථකව ඉටු කර ගැනීමට, විද්‍යාලයේ ගරු විදුහල්පතිතුමිය, නියෝජ්‍ය හා සහකාර විදුහල්පති මහත්ම මහත්මීන්, ගුරු මණ්ඩලය, අනධ්‍යයන කාර්ය මණ්ඩලය, පාසල් සංවර්ධන සමිතිය, ආදි ශිෂ්‍යා සංගමය පාසලේ ආදරණීය දියණියන් හා දෙමව්පියන්, දුන් සහයෝගය මෙම අවස්ථාවේදී කෘතවේදීව හා ගෞරවයෙන් සිහිපත් කරමි. විද්‍යාලයීය ඉදිරි කටයුතු සර්වප්‍රකාරයෙන්ම සාර්ථක වේවා යි ප්‍රාර්ථනා කරමි.

අයේශා දේනෙත්ති මිය
ලේකම් (බෞද්ධ සංගමය)
සංඝමිත්තා බාලිකා විද්‍යාලය

පාසල් සංවර්ධන සමිතිය

සභාපති - එච්.චාන්දනී උඩුකුඹුර මිය, අසේනි ඩී. පරණවිතාන මිය
ලේකම් - ආර්.එම්.කේ. ටී. රත්නායක මයා
භණ්ඩාගාරික - පී.ටී.අලහකෝන් මිය

අප පාසලේ අභිමානවත් ඉතිහාසය තවදුරටත් ඔප්නැංවීමින්, අධ්‍යාපනික, ක්‍රීඩා හා විෂය සමගාමී මෙන්ම විෂය බාහිර ක්‍රියාකාරකම්වලින් විශිෂ්ට දක්ෂතා දැක්වූ දියණියන්ගේ කැපවීම, උනන්දුව සහ පරදුගුණ ඇගයීමට ලක් කිරීම අප සැමගේ වගකීමකි. එමෙන්ම, ඔවුන්ගේ අනාගත අභිවෘද්ධිය වෙනුවෙන් දිරිගැන්වීමක් ලබාදීම ද මෙවැනි ත්‍යාග ප්‍රදානෝත්සවයක ප්‍රධාන අරමුණ වේ.

ඒ අනුව, 2024 වර්ෂය තුළ අධ්‍යාපනික හා විවිධ ක්ෂේත්‍රයන්හි විශිෂ්ට දක්ෂතා දැක්වූ දියණියන් ඇගයීම සඳහා සංවිධානය කරනු ලබන 2024 වර්ෂයේ ත්‍යාග ප්‍රදානෝත්සවය පාසල් කීර්තිනාමය තවදුරටත් ඉහළ නංවන සුවිශේෂී අවස්ථාවක් වනු ඇතැයි අපි විශ්වාස කරමු.

මෙම උත්කර්ෂවත් අවස්ථාව සාර්ථක කර ගැනීම සඳහා පාසල් විදුහල්පතිතුමිය, ආචාර්ය මණ්ඩලය, අනධ්‍යයන කාර්ය මණ්ඩලය, දෙමව්පියන්, ආදි ශිෂ්‍යාවන් සහ පාසල් සංවර්ධන සමිතියේ සියලුම සාමාජික සාමාජිකාවන් ලබාදෙන සහයෝගය ඉතා අගය කොට සළකමු. දියණියන්ගේ අනාගත අභිවෘද්ධිය උදෙසා අප සියලු දෙනාගේ සාමූහික කැපවීම සහ දායකත්වය නිබඳව ලබාදෙන බව ගෞරවයෙන් ප්‍රකාශ කර සිටිමු.

ගාල්ල සංඝමිත්තාවන්ගේ කුසලතා ඇගයීම සඳහා මෙවැනි වාර්ෂික ත්‍යාග ප්‍රදානෝත්සවයක් අඛණ්ඩව සංවිධානය කිරීම වෙනුවෙන් විද්‍යාලාධිපතිතුමියටත්, නියෝජ්‍ය සහ සහකාර විදුහල්පතිතුමියන් හා තුමන්ලාටත්, පාසලේ ආචාර්ය මණ්ඩලයට හා අනධ්‍යන කාර්ය මණ්ඩලයටත් , පාසැල් සංවර්ධනය සමිතිය වෙනුවෙන් අපගේ ගෞරවනීය ස්තුතිය පළ කරන්නෙමු.

මහාචාර්ය ආර්.එම්.කේ.ටී රත්නායක මයා
ලේකම් - පාසල් සංවර්ධන සමිතිය
සංඝමිත්තා බාලිකා විද්‍යාලය

ආදි ශිෂ්‍ය සංගමය

සභාපති	- එච්.චාන්දනී උඩුකුඹුර මිය, අසේනි ඩී. පරණවිතාන මිය
උපසභාපති	- එච්.කේ.ජයතිස්ස මිය
ලේකම්	- යෂ්මදා ලොකුනාරාංගොඩ මිය , භාෂිනී රත්නායක මිය
උපලේකම්	- ගෞරි කත්‍යානා මිය
භාණ්ඩාගාරික	- සී.ජයනි ජයසිංහ මිය

සංඝමිත්තා බාලිකා විද්‍යාලය වසර 107ක් පුරාවට තම යශෝරාවය ලංකා ධරණී තලය පුරා රාව ප්‍රතිරාව නැංවූ අසමසම ප්‍රෞඩත්වයේ සංකේතයකි. තම දස්කම්වලින් සංඝමිත්තාව බැබළවූ අප දියණියන් ඒ වෙනුවෙන් අහිසෙස් ලබන මේ අවස්ථාවේ දී ආදි සංඝමිත්තාවන් ලෙස අප ඔවුන්ට හෘදයාංගම ව සුභාසිංශන එක්කර සිටිමු.

විදුබිමක්, කෙළිබිමක්, රඟහලක් වූ සංඝමිත්තාවේ තටු විදා සරන අපේම සඝමිත් දියණියන් ගුණ, නැණ වැඩූ කාන්තාවන් කිරීමට අප විදුහල කැපවන බව නොරහසකි. සඝමිත් සෙවණෙහි හැදී වැඩුණු එවන්ම සංඝමිත්තාවන් ලෙස අප අපගේ පාසල පිළිබඳව පවතින සදාකාලික ගෞරවනීය බැඳීම සුරකින්නෙමු.

සංඝමිත්තාවන් තම හැකියාවන්ට කිරුළු පළඳින අද දින සමස්ත ආදි ශිෂ්‍යාවන් වෙනුවෙන් ඔවුන්ට සුභාශිංසන එක් කිරීමට ලැබීම පිළිබඳව මා නිහතමානීව සතුටු වෙමි.අප විද්‍යාලයීය ආදර්ශ පාඨය රැගත් සකල ලෙසින් ම සංවර වූ සඟමිත් තෙරණිය වැනි උතුම් කුලඟනන් මේ පිං බිමෙන් අනාගතයේත් බිහි වේවා! යි අප එකම පැතුමයි. තවත් සහස් වසකට අභිමානවත් පුරාවතකට උරුමකම් ඇති සඟමිත් මෑණියන් සැමදා ලකඹරේ සොළොස් කලා පිරි සඳ සේ වැජඹේවා !.

ලේකම් - භාෂිනී රත්නායක මිය
ආදි ශිෂ්‍ය සංගමය - සංඝමිත්තා බාලිකා විද්‍යාලය

සිංහල අංශය

භාර ගුරුභවතා	-	සී.පී.එම්.ටී. ප්‍රියන්ති මිය
සහාය	-	ඩී.එල්.බී. අයෝමා තුෂාරි මිය
	-	සිංහල විෂය ගුරුභවතුන්

ප්‍රාථමික සිංහල භාෂා ඒකකය

භාර ගුරුභවතා	-	එච්.ආර්.කේ. නිමාලි මිය

English Unit

Coordinator of English	-	Mrs. Pramila Keerthirathna
Head of English	-	Mrs. Renuka Rathnaweera
Assistant Head of English	-	Ms. R.U. Jarathna

දෙමළ භාෂා ඒකකය

භාර ගුරුභවතා	-	එම්.එම්.එන්. මස්නූන් මිය
සහාය	-	කේ.පී.කේ. චතුරානි මිය

රථ වාහන හැසිරවීමේ ඒකකය

භාර ගුරුභවතා	-	ඩී.එම්. තිත්තගල්ල මිය

තාරකා විද්‍යා සංගමය

භාර ගුරුභවතා	-	එච්.ආර්.එල්.ඩී. භාෂිණී මිය
සහාය	-	රුවනි නිසංසලා ගමගේ මිය
	-	එරන්දි පියදාස මිය
	-	එස්.එල්.ඊ. ජයවීර මිය

තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ ඒකකය

ඊ මේල් ලිපිනය	-	sanghamitta_balika@yahoo.com
වෙබ් ලිපිනය	-	www.sanghamiththabalikavidyalaya.lk
භාර ගුරුභවතුන්	-	සුලේකා දිසානායක මිය
අනෙකුත් ගුරුභවතුන්	-	එස්.එන්. සූඩිං මිය
	-	ආර්.ඩී. සූරිආරච්චි මිය
	-	ඩී.සී.එල්.ඒ. ජයසිංහ මිය
	-	ඒ.අයි. උදයමාලි මිය
	-	කේ.පී. ලියනගේ මිය
	-	යු.ඩබ්.කේ. කලානි ගුණාසේන මෙය

ග්ලෝබ් ශිෂ්‍ය සංගමය

භාර ගුරුභවතුන්	-	කේ.පී.ඒ. ගුණවර්ධන මිය
		එල්.එම්. විජේසුරේන්ද්‍ර මිය
		ඒ.සී.එච්. ලියනගේ මිය

පරිසර නියමු භට ඒකකය

භාර ගුරුභවතා	-	එම්.ටී.ඩී. ගුණසේකර මිය
සහාය	-	ඩබ්.ඩී.ටී.ඒ. මහාදේව මිය
		එම්.එම්.එන්. මස්නූන් මිය
		ටී.එස්. රණතුංග මිය

ගෘහ විද්‍යා ඒකකය

භාර ගුරුභවතා	-	ජේ.පී.ඩී.එස්. ජයවීර මිය
සහාය	-	එච්.එච්. ලෙට්ට්‍රිෂියා නාලනී මිය
		ඒ.ජී. නිල්මිණි මිය

බටහිර සංගීත ඒකකය

භාර ගුරුභවතා	-	එච්.කේ.එස්. ජයතිස්ස මිය
සහාය	-	බී.එල්.පී.කේ. ලංකාතිලක මිය
	-	චසුනි ද කොස්තා මෙය
පුහුණුකරු	-	පී.ඩබ්. චාමර රොෂාන් මයා

විද්‍යා සංගමය

අංශ ප්‍රධාන ගුරුභවතා	-	යූ.එම්.එස්. ගමගේ මිය
විද්‍යා සංගමය භාර ගුරුභවතා	-	ඩබ්.ඒ.පී. පෙරේරා / එම්.ඒ.සී දයාංගනී

වාණිජ සංගමය

අංශ ප්‍රධාන ගුරුභවතා	-	එම්.බී.එෆ්. රහ්මාන් මයා / ඉවෝන් ගුණසේකර මිය

කලා සංගමය

අංශ ප්‍රධාන ගුරුභවතා	-	ඩබ්.ඩී.ටී.ඒ. මහාදේව මිය
සහාය		අයේෂා දේනෙත්ති මිය

කෘෂි විද්‍යා ඒකකය

භාර ගුරුභවතා	-	කේ.පී.ඒ. ගුණවර්ධන මිය
සහාය	-	ටී.එස්. රණතුංග මිය

ශිෂ්‍යභට බණ්ඩය නාවික

භාර ගුරුභවතා	-	එල්. තනුජා විතාරණ මිය
සහාය	-	දුෂාරි ගුරුසිංහ මිය
		ඒ.එස්. චතුරාණී පෙරේරා මිය

ප්‍රථමාධාර ඒකකය

භාර ගුරුභවතා	-	එච්.අයි. උදේශනී මිය
සහාය	-	ඩබ්.ඒ.ආර්. ස්වර්ණාපාලි මිය
		ලක්ෂ්මි සමරසිංහ මිය
		අයි.එල්. හෙට්ටිආරච්චි මිය

First - aid Kitty

Teacher - in-charge	-	Mrs. H.R.K. Nimali
	-	Mrs.R.M.S. Hemakumari
	-	Mrs.K.P.A.Wasanthi
	-	Miss. K.L.A.D.Chathurika

සන්නිවේදන ඒකකය

භාර ගුරුභවතුන්	-	කේ.පී. චතුරංග දීපාල් මයා
සහාය	-	ඒ.ඩී. දිනූ ලක්මිණී මිය
		එච්.ආර්.එල්.ඩී. භාෂිණී මිය
	-	ජේ.එන්.සී.පී. කීර්තිරත්න
		අයි.එච්. අන්ද්‍රාහැන්නදි මිය

පාසල් පුස්තකාලය

භාර ගුරුභවතුන්	-	එස්. විතානාච්චි මිය
සහාය	-	ආර්.එස්. ජයවර්ධන මිය
	-	ඊ.කේ.එස්. දුෂ්මන්ති මිය

ශිෂ්‍යත්ව

භාර ගුරුභවතුන්	-	එම්.එන්.කේ. පතිරණ මිය

නාට්‍ය අංශය

භාර ගුරුභවතා	-	වයි.එච්. ලක්ෂි චන්දිමා මිය
සහාය	-	ඒ. අබේසිරිනාරායන මිය

නර්තන අංශය

භාර ගුරුභවතා	-	එච්.පී.ජී. නිරූපා මිය
සහාය	-	ඒ.එස්.එම්. රිස්වි මයා
	-	එස්.එස්. නානායක්කාර මිය
	-	එස්.එන්. සූරිආරච්චි මිය

පෙරදිග සංගීත අංශය

භාර ගුරුභවතා	-	ඩී.පී.කේ. දේවසිරිනාරායන මිය
සහාය	-	එස්.ඒ.වී. සරෝජනී මිය
	-	කේ.ඩී.එස්. ලක්මිණී මිය
	-	ටී.ජී.ඒ. ප්‍රදීපා කේ. සෝමතිලක මිය

World Link Society

Teacher-in-charge	-	Mrs.D.K. Weerakkodi

MUN Clunb

Teacher-in-charge	-	Mrs. D.K.Weerakkodi
Assistant Teachers-in-charge	-	Mrs. U.G.D. Priyadarshani
		Mrs.M.N.K. Pathirana
		Mrs.T. Priyanga Peiris

බාලදක්ෂිකා, කුඩා මිතුරු හා සමනලී ඒකකය

භාර ගුරුභවතා	-	ඩබ්.බී.ඩී. සමන්තිකා මිය
කණ්ඩායම් නායිකා ගුරුභවතුන්	-	එන්.ජී. කල්පනී මිය
		අයි.වයි. ගුරුසිංහ මිය
		ඩබ්.එම්.පී. නිලන්ති මිය
		සී.ජේ. ජයසිංහ මිය
		ඒ.ජී. අශෝකමාලා මිය
		ඩී.ඒ. ජයවර්ධන මිය
		නිශාමනී අබේසිරිනාරායන මිය
		ඩබ්.ඩී. සයුරි පූර්ණිමා මිය
		බී.ඒ.කේ. ශාන්ති මිය
		වසන්ති නාගහවත්ත මිය

විවිධ භාෂා ඒකකය

භාර ගුරුභවතුන්

ප්‍රංශ භාෂාව	-	ආර්.ජී. සුවේන්ද්‍රා ආශා නිල්මිණී
ජපන් භාෂාව	-	ඒ.එච්.ජී.ජේ. උදේශිකා මිය (ස්ථාන මාරු)
හින්දි භාෂාව	-	අංජනා කහපොළආරච්චි මිය
චීන භාෂාව	-	සෙව්වන්දි කීර්තිසේන මිය

විවාද හා දැනුම මිනුම සංගමය

භාර ගුරුභවතා	-	පී.ආර්.එස්. ෆොන්සේකා මයා (සිංහල මාධ්‍ය)
	-	එච්.එම්.ඩී.එස්. ජයසිංහ මිය (ඉංග්‍රීසි මාධ්‍ය)

ශිෂ්‍ය නායිකා මණ්ඩලය

භාර ගුරුභවතුන්	-	ඊ.කේ. සදීකා මධුරංගි මිය (එතෙර නිවාඩු)
		ඩී.ආර්. වික්‍රමසිංහ මිය (ස්ථාන මාරු)
		එස්.බී. වටවල මිය
		ඩබ්.ඩී.ටී.ඒ. මහාදේව මිය
		සතීෂා ජයතිස්ස මිය
		යූ.ජී.ඩී. ප්‍රියදර්ශනී මිය

සෞඛ්‍ය ප්‍රවර්ධන සංගමය

භාර ගුරුභවතා	-	ටී.එච්. හෂිනි කසුන්තා ප්‍රේමනාත් මිය
		අයි.බී. අබේසිංහ මෙය

UNESCO සංගමය

භාර ගුරුභවතා	-	ටී. ප්‍රියංගා පීරිස් මිය
සහාය	-	ඒ.ඩබ්. සංජීවනී මිය

ඡායාරූප සංගමය

භාර ගුරුභවතා	-	කේ.සී.රොෂාන් මයා
	-	කපිල පුෂ්පකුමාර මයා
සහාය	-	අයි.වයි. ගුරුසිංහ මිය

උපදේශනය

භාර ගුරුභවතා	-	ජේ.පී.ඩී.එස්. ජයවීර මිය

ක්‍රීඩා අංශය

වොලිබෝල්

භාර ගුරුභවතා	-	අයි.බී. අබේසිංහ මෙය
සහාය	-	එම්.එච්.එල්. ප්‍රියන්තිකා මිය
		එම්.ඒ.සී. ලසන්ති මිය
පුහුණුකරු	-	නිර්මලා ද සිල්වා

නෙට්බෝල්

භාර ගුරුභවතා	-	ඩී.එල්.ඩබ්.එන්. නුවංගි මිය
සහය	-	යූ.ඩබ්.කේ. කලානි ගුණාසේන මෙය
පුහුණුකරු	-	පී.ජේ. අකිලා නිසංසලා මිය

හොකී

භාර ගුරුභවතා	-	ඩී.ජී.එම්. පමුදිනි මිය
සහාය	-	ඒ.අයි. උදයමාලි මිය
	-	ජේ.බී. රාජිනී මිය
	-	ආර්.යූ. ජාරත්න මෙය
පුහුණුකරු	-	මහීන් සංජය මයා

පිහිනුම්

භාර ගුරුභවතා	-	ටී.එච්. හෂිනි කසුන්තා ප්‍රේමනාත් මිය
සහාය	-	ඩී.එල්.සී. මනෝරි විශ්ව කුලරත්න මිය
		ඩී.ජී.එම්. පමුදිනි
	-	රේබා එදිස්සූරිය මිය
	-	බී.වී.පී. දිලුම් ඩයස් මෙය
	-	ඒ.සී.එච්. ලියනගේ මිය
	-	ඉඳුනිල් ජයසේකර මිය
පුහුණුකරු	-	ලක්රුවන් විජේසිරි මයා

ජිම්නාස්ටික්

භාර ගුරුභවතා	-	ටී.එච්. හෂිනි කසුන්තා ප්‍රේමනාත් මිය
සහාය	-	කේ.ජී.අයි. තරංගා මිය
		ඩබ්.ඒ.බී.එස්. භාෂිණි මිය
	-	එම්.කේ.සී. දයාංගනි මිය
පුහුණුකරුවන්	-	සී.ටී. කුමාරගේ මයා
	-	ජී.සී. අබේසුන්දර මිය

බාස්කට්බෝල්

භාර ගුරුභවතා	-	ඒ.ජී.ඩී. නිසංසලා මිය
සහාය	-	ඩබ්.ඒ.පී. පෙරේරා මිය
		එල්.වයි. ලියනගේ මිය
		ඩබ්.ඒ.ටී. මල්ෂිකා මිය
පුහුණුකරු	-	උදිත නිරංජන් මයා

බැඩ්මින්ටන්

භාර ගුරුභවතා	-	එල්. තනුජා විතාරණ මිය
		ඩී.එල්.ඩබ්.එන්. නුවංගි මිය
සහාය	-	එල්.බී. ඉන්ද්‍රානි මිය
		ටී.ඒ.කේ.සී. විදුරංගි මිය
		එම්.ජේ.එච්. ඉෂාරා ජාගොඩ මිය
පුහුණුකරුවන්	-	සුභාෂ් ජනක ද සිල්වා මයා
		හරිඳු මයා

මලල ක්‍රීඩා

භාර ගුරුභවතා	-	එල්. තනුජා විතාරණ මිය
සහාය	-	අයි.බී. අබේසිංහ මෙය
		ඒ.ජී.ඩී. නිසංසලා මිය
පුහුණුකරුවන්	-	පියල් වීරසේකර මයා
		අයි.පී.කේ මුදලිගේ මිය

ටයිකොන්ඩෝ

භාර ගුරුභවතා	-	එල්. තනුජා විතාරණ මිය
		නිරෝෂා කුලසිංහ මිය
පුහුණුකරු	-	රුවන් නිශ්ශංක මයා

වෙස්

භාර ගුරුභවතා	-	එල්. තනුජා විතාරණ මිය
		ජී.ආර්. රසිනි මිය
		අයි.බී. අබේසිංහ මිය
		එස්.එන්.පී. ද සිල්වා මිය
		ඩී.එස්. සුරංගි මිය
සහාය	-	කේ.පී.කේ. චතුරානි මිය
		බී.එල්.කේ. ප්‍රියදර්ශනී මිය
		ටී.එස්. අබේවර්ධන මිය
පුහුණුකරුවන්	-	ගිහාන් පෙරේරා මයා

ස්ක්‍රැබල් ක්‍රීඩාව

භාර ගුරුභවතා	-	එන්.එල්. ළමාහේවා මිය (ස්ථාන මාරු)
		සුවේන්ද්‍රා ආශා නිල්මිණි මිය
සහාය		කේ.ඒ.එස්.ආර්. කුරුවිට මිය
පුහුණුකරු	-	ඩී.ඩබ්.ඩබ්.ඒ.ඩී. නිම්සරා මිය

කරාතේ

භාර ගුරුභවතා	-	කේ.ඩී.අයි. තරංගා මිය
සහාය	-	ජේ.එස්. ජයමාලි මිය
පුහුණුකරු	-	කේ.ඩී.අයි. තරංගා මිය

ඇරොබික් ජිම්නාස්ටික්

භාර ගුරුභවතා	-	කේ. හසිනි කසුන්තා ප්‍රේමනාත් මිය
සහාය	-	වයි.පී.ආර්.ගුණවර්ධන මිය
		ඒ.පී.ඩී. නිසංසලා මිය
		ඉෂංකා මුදලිගේ මිය
පුහුණුකරු	-	අජිත් වනිගසිංහ මයා

ශිෂ්‍යභට

භාර ගුරුභවතා	-	එල්. තනුජා විතාරණ මිය
සහාය	-	ඒ.එස්. චතුරාණි පෙරේරා මිය
		දුෂාරි ගුණසිංහ මෙය

නේවාසිකාගාරය

පාලිකාවන්	-	ඩබ්.ඊ. දිනේෂා දර්ශනී මිය
සහකාර නේවාසිකාගාර පාලිකාව	-	එච්.ඩබ්. නිරූපා සංජීවනී ජයසේකර මිය

සිරි සංඝමිත්තා ශනිදා දහම් පාසල

ප්‍රධානාචාර්ය	-	ස්වර්ණාමාලා වීරසිංහ මෙය
සහාය	-	කේ.පී. ලක්ෂ්මි පතිරණ මිය
		ඩබ්.ආර්.එස්. පීරිස් මිය
		වයි. දොඩංගොඩ මිය

2024 වර්ෂයේ සමස්ත ප්‍රතිඵල සටහන

5 ශ්‍රේණිය ශිෂ්‍යත්වය

ඉදිරිපත් වූ සංඛ්‍යාව	සමත් සංඛ්‍යාව	ප්‍රතිශතය
270	86	31.85 %

අ.පො.ස (සාමාන්‍ය පෙළ) විභාගය

ඉදිරිපත් වූ සංඛ්‍යාව	සමත් සංඛ්‍යාව	ප්‍රතිශතය
390	363	93.08%

අ.පො.ස (උසස් පෙළ) විභාගය

ඉදිරිපත් වූ සංඛ්‍යාව	ඉදිරිපත් සංඛ්‍යාව	සමත් සංඛ්‍යාව	ප්‍රතිශතය
ජීව විද්‍යා විෂය ධාරාව	214	149	69.63 %
භෞතීය විද්‍යා විෂය ධාරාව	68	54	79.41 %
වාණිජ විෂය ධාරාව	107	102	95.33 %
කලා විෂය ධාරාව	128	105	82.03 %
පොදු විෂය ධාරාව	17	09	52.94 %
මුළු ශිෂ්‍ය සංඛ්‍යාව	**534**	**419**	**78.46 %**

2024 - 5 ශ්‍රේණිය ශිෂ්‍යත්වය ප්‍රතිඵල විශ්ලේෂණය

ලකුණු පරාසය	ශිෂ්‍ය සංඛ්‍යාව
ලකුණු 70 ට වැඩි	266 (98.52 %)
ලකුණු 100 ට වැඩි	244 (90.37%)
ඉදිරිපත් වූ සංඛ්‍යාව	270
සමත් සංඛ්‍යාව	86
ප්‍රතිශතය	31.85 %

2024 - අ.පො.ස. සාමාන්‍ය පෙළ විභාගය - ප්‍රතිඵල විශ්ලේෂණය

	විෂයය	පෙනී සිටි සිසුන් ගණන	සමත් සිසුන් ගණන	A	B	C	S	W	සමත් ප්‍රතිශතය
ප්‍රධාන විෂයයන්	බුද්ධ ධර්මය	390	370	268	44	39	19	20	94.87 %
	සිංහල භාෂාව හා සාහිත්‍යය	390	381	235	74	51	21	9	97.69 %
	ඉංග්‍රීසි භාෂාව	390	371	231	66	38	36	19	95.13 %
	විද්‍යාව	390	362	189	53	74	46	28	92.82 %
	ගණිතය	390	353	210	53	56	34	37	90.51 %
	ඉතිහාසය	390	359	246	44	37	32	31	92.05 %
පළමු කාණ්ඩ විෂයයන්	ව්‍යාපාර හා ගිණුම්කරණය								
	සිංහල මාධ්‍යය	99	93	45	28	14	06	06	93.94 %
	ඉංග්‍රීසි මාධ්‍යය	05	05	04	00	01	00	00	100 %
	භූගෝල විද්‍යාව								
	සිංහල මාධ්‍යය	63	07	25	16	13	06	03	95.24 %
	ඉංග්‍රීසි මාධ්‍යය	13	13	12	01	00	00	00	100 %
	පුරවැසි අධ්‍යාපනය	36	31	10	05	12	04	05	86.11 %
	දෙවන බස දෙමළ	90	90	60	19	09	02	00	100%
	ප්‍රංශ භාෂාව	25	24	10	05	07	02	01	96 %
	ජපන් භාෂාව	58	55	30	09	10	06	03	94.83%
	චීන භාෂාව	01	01	01	00	00	00	00	100 %

2024 - අ.පො.ස. සාමාන්‍ය පෙළ විභාගය - ප්‍රතිඵල විශ්ලේෂණය

	විෂයය	පෙනී සිටි සිසුන් ගණන	සමත් සිසුන් ගණන	A	B	C	S	W	සමත් ප්‍රතිශතය
දෙවන කාණ්ඩ විෂයයන්	සංගීතය (පෙරදිග)	47	47	37	07	03	00	00	100 %
	සංගීතය (අපරදිග)	18	18	17	00	01	00	00	100 %
	චිත්‍ර	30	30	14	06	09	01	00	100 %
	නර්තනය	81	69	20	21	19	09	12	85.19 %
	ඉංග්‍රිසි සාහිත්‍යය	121	119	47	36	26	10	02	98.35 %
	නාට්‍ය හා රංග කලාව	92	91	23	26	23	11	01	98.91 %
තෙවන කාණ්ඩ විෂයයන්	තොරතුරු තාක්ෂණය								
	සිංහල මාධ්‍යය	143	142	77	34	24	07	01	99.30%
	ඉංග්‍රීසි මාධ්‍යය	71	71	41	13	13	04	00	100%
	කෘෂි හා ආහාර තාක්ෂණය	15	13	06	03	02	02	02	86.67%
	ගෘහ ආර්ථික විද්‍යාව	37	33	04	08	14	07	04	89.19%
	සෞඛ්‍යය හා ශාරීරික අධ්‍ය.								
	සිංහල මාධ්‍යය	90	88	44	23	13	08	02	97.78%
	ඉංග්‍රීසි මාධ්‍යය	15	15	11	02	01	01	00	100%
	සන්නිවේදනය හා මාධ්‍යය අධ්‍යයනය	19	16	10	03	01	02	03	84.21%

2024 - අ.පො.ස (උසස් පෙළ) විභාගය - ප්‍රතිඵල විශ්ලේෂණය

විෂය අංකය	විෂය	මාධ්‍යය	පෙනී සිටි ශිෂ්‍ය සංඛ්‍යාව	A	B	C	S	F	AB	සමත් ශිෂ්‍ය සංඛ්‍යාව	සමත් ප්‍රතිශතය %
1	භෞතික විද්‍යාව	ඉංග්‍රීසි	10	01	01	02	01	05	00	05	50.00
1	භෞතික විද්‍යාව	සිංහල	269	31	26	59	101	52	00	217	80.67
2	රසායන විද්‍යාව	ඉංග්‍රීසි	10	02	01	01	01	05	00	05	50.00
2	රසායන විද්‍යාව	සිංහල	271	44	35	61	88	43	09	228	84.13
8	කෘෂි විද්‍යාව	සිංහල	23	04	03	11	04	01	00	22	95.65
9	ජීව විද්‍යාව	ඉංග්‍රීසි	10	02	00	01	02	05	00	05	50.00
9	ජීව විද්‍යාව	සිංහල	204	20	20	60	51	47	07	157	76.96
10	සංයුක්ත ගණිතය	සිංහල	85	22	13	21	19	10	01	75	88.24
20	තොරතුරු තාක්ෂණය	ඉංග්‍රීසි	15	01	05	07	01	01	01	14	93.33
20	තොරතුරු තාක්ෂණය	සිංහල	89	10	15	36	23	05	00	84	94.38
21	ආර්ථික විද්‍යාව	සිංහල	83	26	22	21	08	06	00	77	92.77
22	භූගෝල විද්‍යාව	සිංහල	53	27	12	04	06	04	00	49	92.45
23	දේශපාලන විද්‍යාව	සිංහල	46	25	06	04	05	06	00	40	86.96
24	තර්ක ශාස්ත්‍රය	සිංහල	28	11	10	02	04	01	00	27	96.43
57	නාට්‍ය හා රංගකලාව	සිංහල	02	00	00	01	01	01	00	02	100.00

විෂය අංකය	විෂය	මාධ්‍යය	පෙනී සිටි ශිෂ්‍ය සංඛ්‍යාව	A	B	C	S	F	AB	සමත් ශිෂ්‍ය සංඛ්‍යාව	සමත් ප්‍රතිශතය %
25 B	ඉතිහාසය	සිංහල	05	02	02	01	00	00	00	05	100.00
28	ගෘහ ආර්ථික විද්‍යාව	සිංහල	02	00	00	00	02	00	00	02	100.00
29	සන්නිවේදනය හා මාධ්‍යය අධ්‍යයනය	සිංහල	22	09	03	03	02	05	00	17	77.27
31	ව්‍යාපාර සංඛ්‍යානය	ඉංග්‍රීසි	02	00	00	00	02	00	00	02	100.00
32	ව්‍යාපාර අධ්‍යයනය	ඉංග්‍රීසි	01	00	01	00	00	00	00	01	100.00
32	ව්‍යාපාර අධ්‍යයනය	සිංහල	105	37	28	31	06	03	01	102	97.14
33	ගිණුම්කරණය	ඉංග්‍රීසි	01	01	00	00	00	00	00	01	100.00
33	ගිණුම්කරණය	සිංහල	105	59	20	17	07	02	01	103	98.10
45	බෞද්ධ ශිෂ්ටාචාරය	සිංහල	05	03	00	00	01	01	00	04	80.00
51	චිත්‍ර	සිංහල	03	02	01	00	00	00	00	03	100.00
52	නර්තනය(පෙරදිග)	සිංහල	06	01	02	03	00	00	00	06	100.00
54	සංගීතය (පෙරදිග)	සිංහල	04	03	01	00	00	00	00	04	100.00
71	සිංහල භාෂාව		78	35	16	13	12	02	00	76	97.44
73	ඉංග්‍රීසි භාෂාව		07	00	00	00	04	03	00	04	57.14
81	ප්‍රංශ භාෂාව		12	03	04	02	00	02	00	10	83.33
84	හින්දි භාෂාව		01	01	00	00	00	00	00	01	100.00
86	චීන භාෂාව		12	01	02	07	02	00	00	12	100.00
87	ජපන් භාෂාව		31	05	06	09	11	00	00	31	100.00

විද්‍යාලයීය කළමනාකරණ මණ්ඩලය - 2024

1.	අසේනි ඩී. පරණවිතාන මිය	- විදුහල්පතිනිය (2024-08-15 සිට)
2.	එච්. චාන්දනී උඩකුඹුර මිය	- විදුහල්පතිනිය (2024-07-22 දක්වා)
3.	නිශාන්ති කැටිපෙආරච්චි මිය	- නියෝජ්‍ය විදුහල්පතිනිය (පරිපාලන) ස්ථාන මාරු
3.	එම්.එම්. වාකිෂ්ඨ මිය	- නියෝජ්‍ය විදුහල්පතිනිය (පරිපාලන)
4.	ඩී.එස්. සමරහේවා මෙය	- නියෝජ්‍ය විදුහල්පතිනිය (විෂය සමගාමී)
5.	ශාන්තා එන්. ප්‍රේමරත්න මිය	- නියෝජ්‍ය විදුහල්පතිනිය (අධ්‍යාපන සංවර්ධන) ස්ථාන මාරු
6.	කේ.එම්.ජී.පී.කේ. ඩයස් මයා	- නියෝජ්‍ය විදුහල්පති (අධ්‍යාපන සංවර්ධන හා 9,10,11 ශ්‍රේණි)
7.	එස්.එම්.එන්.එල්. සමරකෝන් මිය	- සහකාර විදුහල්පතිනිය (ප්‍රාථමික) අනුයුක්ත
8.	වයි.ජී.එස්. ප්‍රශාන්ති මිය	- සහකාර විදුහල්පතිනිය (උසස් පෙළ)
9.	එස්.ඩී. විජේසිංහ මිය	- සහකාර විදුහල්පතිනිය (6,7,8 ශ්‍රේණි)
10.	බී.එල්. පද්මමාලි මිය	- සහකාර විදුහල්පතිනිය (ප්‍රාථමික)
11.	යූ.එම්.එස්. ගමගේ මිය	- අංශ ප්‍රධාන (විද්‍යා අංශය)
12.	එම්.බී.එෆ්. රහ්මාන් මයා	- අංශ ප්‍රධාන (වාණිජ අංශය)
13.	ඩබ්.ඩී.ටී.ඒ. මහාදේව මිය	- අංශ ප්‍රධාන (කලා අංශය)
14.	ඩී.කේ. වීරක්කොඩි මිය	- අංශ ප්‍රධාන (ඉංග්‍රීසි මාධ්‍ය 6-11 ශ්‍රේණි)
15.	එස්.එස්. සූරියබණ්ඩාර මිය	- ශ්‍රේණි ප්‍රධාන (11 ශ්‍රේණිය)

විද්‍යාලයීය කළමනාකරණ මණ්ඩලය - 2024

16. ඩී.කේ. සේනානායක මිය - ශ්‍රේණි ප්‍රධාන (10 ශ්‍රේණිය)
17. එස්.බී. වටවල මිය - ශ්‍රේණි ප්‍රධාන (9 ශ්‍රේණිය)
18. එම්.එන්.කේ. පතිරණ මිය - ශ්‍රේණි ප්‍රධාන (8 ශ්‍රේණිය)
19. එස්.ඩබ්. සමරසේකර මිය - ශ්‍රේණි ප්‍රධාන (7 ශ්‍රේණිය)
20. ටී.එස්. රණතුංග මිය - ශ්‍රේණි ප්‍රධාන (6 ශ්‍රේණිය)
21. කේ.එම්.පී. අමරසිළි මිය - ශ්‍රේණි ප්‍රධාන (5 ශ්‍රේණිය)
22. ඒ.වී.එස්. ශාන්ති කුමාරි මිය - ශ්‍රේණි ප්‍රධාන (4 ශ්‍රේණිය)
23. කේ.පී. කරුණාවතී මිය - ශ්‍රේණි ප්‍රධාන (3 ශ්‍රේණිය)
24. කේ.පී.ඒ. වසන්ති මිය - ශ්‍රේණි ප්‍රධාන (2 ශ්‍රේණිය)
25. බී.ඒ.කේ. ශාන්ති මිය - ශ්‍රේණි ප්‍රධාන (1 ශ්‍රේණිය)

විද්‍යාලයීය කළමනාකරණ මණ්ඩලය - 2026

1.	අසේනි ඩී. පරණවිතාන මිය	-	විදුහල්පතිනිය
2.	එම්.එම්. වාකිෂ්ඨ මිය	-	නියෝජ්‍ය විදුහල්පතිනිය (පරිපාලන)
3.	ඩී.එස්. සමරහේවා මෙය	-	නියෝජ්‍ය විදුහල්පතිනිය (විෂය සමගාමී)
4.	ඩී.එල්. ගිණිගේ මිය	-	නියෝජ්‍ය විදුහල්පතිනිය (අධ්‍යාපන සංවර්ධන)
5.	කේ.එම්.පී.පී.කේ. ඩයස් මයා	-	නියෝජ්‍ය විදුහල්පති (අධ්‍යාපන සංවර්ධන)
6.	වයි.පී.එස්. ප්‍රශාන්ති මිය	-	සහකාර විදුහල්පතිනිය (පරිපාලන)
7.	එස්.ඩී. විජේසිංහ මිය	-	සහකාර විදුහල්පතිනිය (පරිපාලන)
8.	බී.එල්. පද්මමාලි මිය	-	සහකාර විදුහල්පතිනිය (ප්‍රාථමික)
9.	ඒ.පී.බී. පුෂ්පරාණි මිය	-	සහකාර විදුහල්පතිනිය (විෂය සමගාමී)
10.	එස්.එස්. සූරියබන්ඩාර මිය	-	ශ්‍රේණි සමායෝජක (9 - 11ශ්‍රේණි)
11.	ජේ.බී. රාජනී මිය	-	ශ්‍රේණි සමායෝජක (6 - 8 ශ්‍රේණි)
12.	ඩී.වී.ඩී.ඩී. ජිනදාස මයා	-	ශ්‍රේණි සමායෝජක (1 - 5 ශ්‍රේණි)
13.	පී. ටී. අලහකෝන් මිය , යූ.එච්. ලුවිනි නිලුෂිකා මිය	-	පාසල් සංවර්ධන සමිති භාණ්ඩාගාරික
14.	පී.ජේ.ඩබ්. විජිතබන්දු මයා	-	කළමනාකරණ කමිටු සාමාජික
15.	අනුෂ්කා ද සිල්වා මිය , එම්.කේ.සී. දයාංගනී මිය	-	ශ්‍රේණි ප්‍රධාන (විද්‍යා අංශය)
16.	ඉවොන් ගුණසේකර මිය , කේ.එල්.පී. අනුරාධා මිය	-	ශ්‍රේණි ප්‍රධාන (වාණිජ අංශය)
17.	ලාලනී ප්‍රියන්තිකා මිය	-	ශ්‍රේණි ප්‍රධාන (කලා අංශය)
18.	සරසි වටවල මිය	-	ශ්‍රේණි ප්‍රධාන (11 ශ්‍රේණිය)
19.	දුෂාරි ගුරුසිංහ මිය	-	ශ්‍රේණි ප්‍රධාන (10 ශ්‍රේණිය)
20.	ටී.ඒ.කේ.සී. විදුරංගි මිය	-	ශ්‍රේණි ප්‍රධාන (9 ශ්‍රේණිය)

විද්‍යාලයීය කළමනාකරණ මණ්ඩලය - 2026

21.	රුවනි ගමගේ මිය	-	ශ්‍රේණි ප්‍රධාන (8 ශ්‍රේණිය)
22.	උදයකාන්ති ජාරත්න මිය	-	ශ්‍රේණි ප්‍රධාන (7 ශ්‍රේණිය)
23.	යූ.සී. නිල්මිණී මිය	-	ශ්‍රේණි ප්‍රධාන (6 ශ්‍රේණිය)
24.	සී.ඩී. වීරතුංග මිය	-	ශ්‍රේණි ප්‍රධාන (5 ශ්‍රේණිය)
25.	කේ.එම්.පී. අමරසිලි මිය	-	ශ්‍රේණි ප්‍රධාන (4 ශ්‍රේණිය)
26.	ඒ.වී. ශාන්ති මිය	-	ශ්‍රේණි ප්‍රධාන (3 ශ්‍රේණිය)
27.	නිෂාමනී අබේසිරිනාරායන මිය	-	ශ්‍රේණි ප්‍රධාන (2 ශ්‍රේණිය)
28.	නදීෂානි මෙන්ඩිස් මිය	-	ශ්‍රේණි ප්‍රධාන (1 ශ්‍රේණිය)

ගා/සංඝමිත්තා බාලිකා විද්‍යාලය - ආචාර්ය මණ්ඩලය 2024

1 අසේනි ඩී. පරණවිතාන මිය - විදුහල්පතිනිය
2 එච්. චාන්දනී උඩකුඹුර මිය - විදුහල්පතිනිය
3 නිශාන්ති කැටිපෙආරච්චි මිය - නි.වි.
4 එම්.එම්. වාකිෂ්ඨ මිය - නි.වි.
5 ඩි.එස්. සමරහේවා මෙය - නි.වි.
6 කේ.එම්.ජී.පී.කේ. ඩයස් මයා - නි.වි.
7 එස්.එන්. ප්‍රේමරත්න මිය - ස.වි. (ස්.මා)
8 එස්.එම්.එන්.එල්. සමරකෝන් මිය - ස.වි. (අනුයු)
9 ටයි.ජී.එස්. ප්‍රශාන්ති මිය - ස.වි.
10 එස්.ඩී. විජේසිංහ මිය - ස. වි.
11 ඩී.ජී.ඩී.එස්. සිරිවර්ධන මිය - ස.වි.
12 ජී.ජී.ටී.කේ. ගුණවර්ධන මිය - ස.වි.
13 එන්.එල්. ළමාහේවා මිය - ස.වි.
14 ඩබ්.එම්.පී. නිලන්ති මිය - ස.වි.
15 ඩී.එස්.එච්. පතිරණ මිය - ස.වි
16 එල්.ඩී. ප්‍රදීපිකා කුමාරි මිය - ස.වි.
17 ආර්. එස්. ජයවර්ධන මිය
18 එම්. බී. එෆ්. රහ්මාන් මයා
19 ඩී. එල්. බී. අයෝමා තුෂාරි මිය
20 එස්. බී. වටවල මිය
21 බී.ඒ.කේ. ශාන්ති මිය
22 ටී. එස්. රණතුංග මිය (ස්ථාන මාරු)
23 අයි. වයි. ගුරුසිංහ මිය
24 ඩී. එල්. පර්ලි ප්‍රියම්බිකා මිය
25 කේ. සී. රොෂාන් මයා (ස්ථාන මාරු)
26 ඩබ්.පී.එස්. ප්‍රියශාන්ත මයා
27 වයි. එච්. ලක්ෂි චන්දිමා මිය (ස්ථාන මාරු)
28 ඒ. වී. එස්. ශාන්ති කුමාරි මිය
29 එන්.වි. කලංසූරිය මිය
30 කේ. එන්. කෙම්ස් මයා (ස්ථාන මාරු)
31 අයේෂා දේනෙත්ති මිය (ස්ථාන මාරු)
32 කේ. ඒ. ඩී. පී. ප්‍රසාද් මයා (ස්.මා.)
33 එස්. විතානාච්චි මිය
34 එම්. ටී. ඩී. ගුණසේකර මිය
35 පී. ආර්. එස්. ෆොන්සේකා මයා
36 ඩබ්. ඩී. ටී. ඒ. මහාදේව මිය (ස්.මාරු)
37 එස්. ඩබ්. සමරසේකර මිය
38 කේ. කේ. සූරියආරච්චි මයා
39 ඩී. ඒ. පී. අයි. ද සිල්වා මයා
40 ලෙෂිකා මධුරංගි විජේසුරේන්ද්‍ර මිය
41 ඩී. කේ. සේනානායක මිය
42 ඒ. ඩී. දිනූ ලක්මිණි මිය
43 එස්. එන්. සූඩිං මිය
44 ඊ.කේ. සදීකා මධුරංගි මිය (එතෙර නිවාඩු)
45 සජීව රණවීර මයා
46 එල්. තනුජා විතාරණ මිය

ගා/සංඝමිත්තා බාලිකා විද්‍යාලය - ආචාර්ය මණ්ඩලය 2024

47 ඩබ්.එම්. කලනි පී සේනාරත්න මිය
48 එච්.ආර්.කේ. නිමාලි මිය (ප්‍රසූත)
49 ආර්.එම්.එස්. හේමකුමාරි මිය
50 ටී.එච්. එච්.කසුන්තා ප්‍රේමනාත් මිය (ප්‍ර.නි.)
51 ඩී.කේ. විරක්කොඩි මිය
52 එම්.එම්.එන්. මස්නූන් මිය (ස්.මා)
53 ඒ. ඩබ්. සංජීවනී මිය
54 ඉවෝන් ගුණසේකර මිය
55 ජේ. එන්. සී. පී. කීර්තිරත්න මිය
56 එස්. එස්. සූරියබණ්ඩාර මිය
57 බී. එල්. පී. කේ. ලංකාතිලක මිය
58 එස්. එල්. ඊ. ජයවීර මිය
59 ජී. ආර්. රසිනි මිය
60 එච්. කේ. එස්. ජයතිස්ස මිය
61 එම්. පේරුසිංහ මෙය
62 කේ. එල්. පී. අනුරාධා මිය
63 පී. ටී. අලහකෝන් මිය
64 කේ. පී. කේ. චතුරානි මිය
65 ඒ. පී. ජී. වී. පී. අමරසිංහ මිය (එ.නිවාඩු)
66 කේ. ජී. ඒ. ගුණවර්ධන මිය
67 යූ.එම්.එස්. ගමගේ මිය
68 ඩබ්.ඒ.ආර්. ස්වර්ණාපාලි මිය
69 කේ.පී.ඩී. චන්ද්‍ර මිය
70 ඒ. අබේසිරිනාරායන මිය
71 එච්.එස්.ඩී. ද සිල්වා මිය
72 ඊ.කේ.එස්. දුෂ්මන්ති මිය (ස්.මා)
73 එච්.පී.ජී. නිරූපා මිය
74 ඩබ්.ඒ.ජේ.ආර්. වික්‍රමතිලක මිය
75 එස්.ඒ.වී. සරෝජනී මිය
76 ඩී. ජයවර්ධන මයා
77 එල්.එන්. මෙන්ඩිස් මිය
78 ඒ.සී.එච්. ලියනගේ මිය (ස්.මා)
79 පී. ආර්. එච්.සී. අමරවීර මයා (ස්.මා)
80 ආර්. ඩී. සූරිආරච්චි මිය
81 ඩී.සී.එල්.ඒ. ජයසිංහ මිය
82 කේ.එස්.ඒ. ද සිල්වා මිය
83 කේ.පී. චතුරංග දීපාල් මයා
84 ආර්. ෆොන්සේකා මිය (ස්ථාන මාරු)
85 එන්. පී. කල්පනී මිය
86 ඩබ්. බී. ඩී. සමන්තිකා මිය
87 එච්. අයි. උදේශනී මිය
88 පී. එස්. කලංසූරිය මිය (දේශීය නිවාඩු)
89 ඩබ්. එම්. සී. ඒ. කේ. විජේකෝන් මිය (එ.නිවාඩු)
90 ජේ. බී. රාජිනී මිය
91 එච්. ආර්. එල්. ඩී. භාෂිණි මිය (එතේර නි.)
92 තේජා සුභාෂිණි දහනායක මිය (ස්.මා)

ගා/සංඝමිත්තා බාලිකා විද්‍යාලය - ආචාර්ය මණ්ඩලය 2024

93 සී. ඩී. විරතුංග මිය
94 ඩී. වී. දිමුතු දර්ශන පිනදාස මයා
95 කේ.එම්.පී. අමරසිලි මිය
96 ඩබ්.එස්. ජීවරාණි මිය
97 එච්. එල්. සී. රත්නවීර මයා
98 එම්. එච්. එල්. ප්‍රියන්තිකා මිය
99 එච්.එල්. පද්මා ජයන්ති මිය
100 ඩී. එම්. තිත්තගල්ල මිය
101 වයි.එන්. අබේගුණාවර්ධන මිය (විශ්‍රාම)
102 එස්. එන්. අබේවර්ධන මිය
103 එච්. එච්. ඊ. පියදාස මිය
104 පී. ඩී. රුවන්පතිරණ මිය
105 යූ. කේ. එස්. පී. යාපා මිය
106 අයි. බී. සමරක්කොඩි මිය
107 එම්. එන්. කේ. පතිරණ මිය
108 කේ. ඒ. එස්. ආර්. කුරුවිට මිය
109 යූ. පී. ඩී. ප්‍රියදර්ශනී මිය
110 ආර්.එල්. ගුරුගේ මිය (විශ්‍රාම)
111 ජේ. පී.ඩී.එස්. ජයවීර මිය
112 ටී. ප්‍රියංගා පීරිස් මිය
113 සී.පී.එම්.ටී. ප්‍රියන්ති මිය
114 ඩී.කේ. රම්‍යා සමන්තිකා මිය
115 බී.එල්.කේ. ප්‍රියදර්ශනී මිය
116 ඩී. ආර්. එස්. රත්නවීර මිය
117 ආර්. යූ. ජාරත්න මෙය
118 ඒ.එස්.එම්. රිස්වි මයා
119 එච්. එච්. ලෙට්ට්‍රිෂියා නාලනී මිය (විශ්‍රාම)
120 කේ. පී. ඒ. වසන්ති මිය
121 ආර්. පී. සුවේන්ද්‍රා ආශා නිල්මිණි මිය
122 පී. ඩබ්. විජිතබන්දු මයා
123 ඩී. පී. කේ. දේවසිරිනාරායන මිය
124 කේ.පී. කරුණාවතී මිය
125 චින්තා එන්. රත්නායක මිය (ස්.මා)
126 ඒ.පී. ඉගෙල්පෙරුමාච්චි මිය
127 ආර්.ඩී. ශිරාණි මිය
128 කේ.ආර්. සේනානායක මිය
129 ඩී.ඒ. ජයවර්ධන මිය
